# ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රියාවලිය සහ විකල්ප ජන්ද භාවිතය:

## විකල්ප ජන්ද භාවිතයේ දේශීය ප්‍රවණතා සහ අභියෝග





ප්‍රකාශනය

නිදහස් හා සාධාරණ මැතිවරණ සඳහා ජනතා ක්‍රියාකාරීත්වය - PAFFREL - පැෆ්රල්

ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රියාවලිය සහ විකල්ප ජන්ද භාවිතය:
විකල්ප ජන්ද භාවිතයේ දේශීය ප්‍රවණතා සහ අභියෝග

© මංජුල ගජනායක

ප්‍රථම මුද්‍රණය : 2022 දෙසැම්බර්

ISBN 978-624-00000-0-0

**පරිගණක නිමැවුම**
වාක්‍යා රූ
දුරඇමතුම : 077 2085805 / 0112 708377

**ප්‍රකාශනය**
නිදහස් හා සාධාරණ මැතිවරණ සඳහා
ජනතා ක්‍රියාකාරීත්වය - PAFFREL - පැෆ්රල්

**මුද්‍රණය**



**ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රියාවලිය සහ විකල්ප ජන්ද භාවිතය:**

# විකල්ප ජන්ද භාවිතයේ දේශීය ප්‍රවණතා සහ අභියෝග

ප්‍රකාශනය:
**නිදහස් හා සාධාරණ මැතිවරණ සඳහා**
**ජනතා ක්‍රියාකාරීත්වය - PAFFREL - පැෆ්රල්**

---

නිදහස් හා සාධාරණ මැතිවරණ සඳහා ජනතා ක්‍රියාකාරීත්වයේ - (PAFFREL) ඇරයුම මත මෙම පර්යේෂණය සිදුකොට, පර්යේෂණ වාර්තාව ඉදිරිපත් කරන ලද්දේ පර්යේෂක මංජුල ගජනායක විසින් ය. mgajanayake@gmail.com යන විද්‍යුත් ලිපිනය හෝ +94772298565 යන ජංගම දුරකථන අංකය ඔස්සේ ඔහු හා සම්බන්ධ විය හැකිය.

**පර්යේෂණ වාර්තා සම්පාදකවරයාගේ විශේෂ ස්තූතිය:**

මෙම පර්යේෂණ වාර්තාව ඉදිරිපත් කිරීම සඳහා ඇරයුම් කිරීම උදෙසා පැෆ්රල් සංවිධානයේ විධායක රෝහණ හෙට්ටිආරච්චි මහතා ප්‍රමුඛව, අනෙක් අවැසි ප්‍රවර්තන සහය සැළසීම උදෙසා එහි උපෙක්ෂි ප්‍රනාන්දු, සුජීව ගයානාත්, සත්‍යා සිවා සහ මිරාල් අයේෂ්මන්ත යන අය වෙත පර්යේෂකයාගේ නොවක් ස්තූතිය හිමිය.

# පූර්ව ඡන්ද භාවිතය හා එහි ජාත්‍යන්තර සංදර්භය:

## ප්‍රවේශය:

විකල්ප ඡන්ද භාවිතය මැතිවරණ කළමණාකරණයේ නූතන ප්‍රවණතාවකි. මැතිවරණ ක්‍රියාවලියක අවශ්‍යයෙන්ම පැවතිය යුතු පූර්ණ ඡන්දදායක සහභාගිත්වය සාක්ෂාත් කිරීමේ විවිධ ක්‍රමවේද ලෝකයේ විවිධ කලාපවල පිහිටි ප්‍රජාතන්ත්‍රීය රාජ්‍යයය උපයෝගී කරගැනීම සාමාන්‍ය ක්‍රියාවලියයි. එහිලා අතීත මැතිවරණ කළමනාකරණය තුළ මැතිවරණ ක්‍රියාවලියට මඟ හැරෙන පුද්ගලයන්/පාර්ශව හෝ කණ්ඩායම් පිළිබඳව බරපතල හැඟීමක් තිබුණු බවට වන ප්‍රබල මැදිහත්වීමක් ඇස නොගැටේ. එහෙත් සහශ්‍රකය ලැබීමත් සමඟ ඒ ඒ රාජ්‍යය තම මැතිවරණ ක්‍රියාවලියේ පවත්නා සුවිශේෂතා මෙන්ම අභියෝග කෙරෙහි වෙසෙස් අවධානයක් දක්වා තිබූ බව පෙනී යන්නේය.

මෙහිලා වඩාත් වැදගත් එක් සාධකයක් නම් එක් එක් රාජ්‍යය තම මැතිවරණ ක්‍රියාවලිය තුළ ඡන්දය භාවිත කිරීම සඳහා සළස්වා ඇති විධිවිධාන තුළ පවත්නා විවිධත්වය හා එක් එක් ඡන්දදායකයා තම ඡන්දය භාවිත කරන ආකාරයයි. ලෝකයේ ඡන්ද භාවිතය තුළ ඒකමිතික සාම්‍යයක් දක්නට නොලැබේ. එමෙන්ම නීති පද්ධතියේ ද පවතින්නේ සාතිශය වෙනස්කමකි.

# මැතිවරණ මෙහෙයුමක පවත්නා විවිධත්වය :

මැතිවරණ ක්‍රියාවලියෙහි පවත්නා විවිධත්වය ඡන්ද භාවිතයේ පමණක් නොව ඡන්ද ලියාපදිංචියේ සිටම දෘශ්‍යමාන වන එකකි. ඊට අදාළ කෙටි විග්‍රහයක් Shannon Schumacher And Aidan Connaughton විසින් පළකොට ඇති අතර මෙහි විස්තර වන්නේ එකී විග්‍රහය හා සබැඳි කෙටි සමාලෝචනයකි.

ලොව රාජ්‍යය අතරින් හරි අඩක ඡන්ද ලියාපදිංචිය අනිවාර්යය. එහිලා රාජ්‍යය 226 ක් අතරින් 122 ක් පමණ ඡන්ද ලියාපදිංචිය අනිවාර්ය කොට සැළකීමට අදාළ ක්‍රමවේද පවත්වා ගෙන යයි. ආර්ජන්ටිනාව, චිලී, හංගේරියාව, ඊශ්‍රායලය, සහ නෙදර්ලන්තය වැනි රටවල ඡන්දදායක ලියාපදිංචිය ස්වයංක්‍රියව සිදුකරන කාර්යයක් බවට පත්කොට ඇත. එහෙත් තවත් රටවල් රාශියක එලෙස ලියාපදිංචි නොවීම දඬුවම් ලැබිය යුතු වරදකි. ඡන්දදායකයන් තමන් විසින්ම ලියාපදිංචි වීම අත්‍යවශ්‍යය. ශ්‍රී ලංකාවද එකී යාන්ත්‍රණයේ වැඩි බරක් ජනතාව වෙත පවරා ඇති බව පෙනී යයි. එහෙත් ලියාපදිංචි නොවුණා කියා සිදුවිය හැකි අනර්ථය ඡන්ද භාවිතයට අවස්ථාව හිමි නොවීමයි. ඊට සමගාමීව නවසීලන්තය, ටොන්ගා සහ එක්සත් රාජධානිය වැනි රටවල්, ඡන්දදායකයන් ලියාපදිංචි නොවීම දඬුවම් ලැබිය හැකි වරදක් සේ අර්ථ ගන්වා ඊට අදාළව නීතිය බලාත්මක කොට ඇත.

මෙහිලා විශේෂයෙන් සඳහන් කල යුතු කරුණක් වන්නේ ලොව රටවල් 90 කට ආසන්න ප්‍රමාණයක් ලියාපදිංචිය අත්‍යාවශ්‍ය සාධකයක් සේ නොසැලකීමයි. එහෙත් ඡන්ද භාවිතය සඳහා ලියාපදිංචිය අනිවාර්යය. ඉන්දියාව වැනි විසල් ප්‍රජාතන්ත්‍රීය රටක් පවා අදාළ සංගණන දත්ත උපයෝගී කරගනිමින් ඡන්දදායක ලියාපදිංචිය නිරතුරුව ස්වයංක්‍රිය ක්‍රියාවලියක් සේ ක්‍රියාවට නගයි. එහි තවත් මඳක් වෙනස් ආකාරයේ අත්දැකීමක් ගෙණෙන රටක් වන්නේ ඇමෙරිකා එක්සත් ජනපදයයි. එහි උතුරු දකොටා පළාතේ ඡන්දහිමියන්ගේ ලියාපදිංචියක් සිදු නොවේ.



අනෙක් කරුණ ඡන්දහිමියෙක් වීමේ අවම වයසයි. එහිදී ˆස෴ ඍකැජඑදරක ණබදඅකැටැ හැඑඅදරන මඟින් සිදුකල සමීක්ෂණයකදී තහවුරු වූයේ රටවල් සහ වෙනත් නිත්‍යානුකූල පාලන ප්‍රදේශ 205 ක පමණ ඡන්දය ප්‍රකාශ කිරීමේ අවම වයස 18 ය යන්නයි. වයස 18 ට අඩු ඡන්දදායකයන් සඳහා ද තම ඡන්දය භාවිත කිරීමට අවස්ථාව ලබා දී ඇති රටවල් ගණන 12 කි. එහිලා එලෙස ඡන්දභාවිතයට අවසර දී ඇති අඩුම වයස අවුරුදු 16 කි. ඊට ආර්ජන්ටිනාව, ඔස්ට්‍රියාව, සහ බ්‍රසීලය යන රටවල්ද අයත්ය. ඊට ප්‍රතිපක්ෂව එක්සත් අරාබි එමීර් රාජ්‍යය එකී වයස් සීමාව අවුරුදු 25 සේ සළකනු ලබන්නේය. ඉතාලියද අනුගමනය කරන ප්‍රතිපත්තිය වෙනස් එකකි. පහළ මන්ත්‍රණ සභාව සඳහා අදාළ ඡන්ද භාවිතයේ වයස අවුරුදු 18 ක් ලෙසත් සෙනෙට් සභාව සඳහා එය අවුරුදු 25 ක් ලෙසත් ඔවුන් සළකනු ලබන්නේය.

තවද කොවිඩ් 19 ව්‍යවසනයට පෙර රටවල් 166 ක් අතරින් 40 ක්ම තැපැල් ඡන්ද භාවිතයට ප්‍රමුඛත්වය දී ඇති බව පෙනී යයි. ශ්‍රී ලංකාව, ඉන්දුනීසියාව, ඉන්දියාව, දකුණු කොරියාව වැනි රටවල් ඉන් ප්‍රමුඛය. ඉනිදු රටවල් සහ නිත්‍යානුකූල පාලන කලාප 227 ක් අතරින් 209 ක්ම තැපෑල ඡන්ද ලකුණු කිරීම යාන්ත්‍රිකව සිදුනොකරයි.

ඡන්ද භාවිතයේදී සමහර රටවල් මිශ්‍ර ක්‍රමයක් අනුගමනය කරන බව පෙනී යයි. ඒ ඡන්ද පත්‍රිකා සළකුණු කිරීම සහ විද්‍යුත් ඡන්ද ක්‍රමය යන විධික්‍රම දෙකයි. ඇමෙරිකා එක්සත් ජනපදය, සහ ඉන්දියාව වැනි විශාල රටවල් මෙන්ම සිංගප්පූරුව වැනි කුඩා රාජ්‍යය විද්‍යුත් ඡන්ද ක්‍රමය වෙත බැඳී ඇතිබවක්ද නිරීක්ෂණය වේ.

ඊට අමතර වශයෙන් අන්තර්ජාලය ඇසුරෙන් ඡන්ද භාවිතයේ නිරත රාජ්‍යය ගණන 04 කි. ඒ ආර්මේනියා, කැනඩා, එස්ටෝනියා සහ ස්විට්සර්ලන්තය ලෙසිණි.

# පර්යේෂණයේ අරමුණු සහ ස්වභාවය:

පසුගිය පාර්ලිමේන්තු ඡන්දය ප්‍රමුඛව මෑතකාලීනව මෙරටේ පැවති ජාතික මෙන්ම ප්‍රාදේශීය (පළාත් පාලන) මට්ටමේ මැතිවරණ හා ඡන්ද විමසීම් තුළ දක්නට ලැබුණු ප්‍රමුඛතම ලක්ෂණයක් වන්නේ සැළකිය යුතු මට්ටමේ පිරිසකට තම ඡන්දය භාවිත කිරීමේ අයිතිය උරගා බලන්නට අවස්ථාවක් හිමි නොවීමයි. එහිලා බොහෝ විට නැගෙන ප්‍රතිතර්කය වන්නේ තම ඡන්දය භාවිත නොකරන පිරිසක්ද ඕනෑම ජන සමාජය සිටින්නේය යන්නයි. එහෙත් ඊට අදාළ සංඛ්‍යාලේඛන සහ දත්ත පිරික්සීමේදී මෙන්ම අදාළ පිරිස් අතරින් යම් කොටසක් හමුවීමේදී සාතිශය සුපැහැදිලි කරුණක් වන්නේ ඡන්දය ප්‍රකාශ කිරීමේ අභිලාෂයෙන් පසු වූ විශාල පිරිසක් ඊට අදාළ පහසුකම් නොලැබීම හේතුවෙන් ඡන්දපොළට ප්‍රවේශව නැති බවයි. එය සමස්ත ලියාපදිංචි ඡන්දදායකයන් හා සැසඳීමේදී 20% ක පමණ ප්‍රමාණයකි.

ඒ අනුව මෙම ප්‍රයත්නයෙහි ප්‍රමුඛතම අරමුණ වන්නේ මිලියන 4 කට ආසන්නව තම ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ පිරිස් නිවැරදිව හඳුනා ගැනීමයි. ඊටත් අමතර වශයෙන් අදාළ පිරිස් සඳහා ඡන්ද භාවිතයට අදාළ පහසුකම් ප්‍රවර්ධනයේදී තත්කාලීන නෛතික සහ සමාජ සැකැස්ම කවරාකාරද යන්නද විමසුමට ලක් කෙරේ.

මෙම පර්යේෂණ කාර්යය තුළ වෙසෙසින්ම නිරීක්ෂණයට හා විමසුමට ලක්කරනු ලබන්නේ මෙරටේ මැතිවරණ ක්‍රියාවලිය තුළ ඡන්ද අයිතිය තිබියදීත් තම පරමාධිපත්‍යය බලය අභ්‍යාස කිරීමට අසමත් වන ඡන්දදායකයන් කවුරුන්ද යන වග හඳුනා ගැනීම සහ ඊට බලපා ඇති හේතු වඩාත් පුළුල්ව විමසුමට ලක්කිරීමයි. ඊටත් වැඩිමනත් වශයෙන් එකී පුද්ගලයන් සහ පාර්ශව වෙත අදාළ අයිතිය සුරක්ෂිත කරගැනීම උදෙසා



ගත හැකි ක්‍රියාමාර්ග ද මෙහි සටහන්ව ඇත. එපමණක් නොව අදාළ වගකීම් භාරය පැවරී ඇති පාර්ශව වන මෙරටේ මැතිවරණ කළමනාකරණ ආයතනය වන මැතිවරණ කොමිෂන් සභාව සහ රජයේ අනෙක් පාර්ශව විසින් ඉටුකළ යුතුව පවත්නා කාර්යපරිපාටින් පිළිබඳව ද ප්‍රමාණවත් කරුණු සමුදායක් ඉදිරිපත් කොට ඇත.

# ඉලක්කගත කණ්ඩායම

මෙහිලා ඉලක්කගත කණ්ඩායම බවට පත්වන්නේ ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රියාවලිය තුළ විවිධ දුෂ්කරතා හේතුවෙන් තම ඡන්ද බලය අභ්‍යාස කිරීමට නොහැකිවන පිරිසයි. ඊට අමතර වශයෙන් අදාළ කරුණේදී අවශ්‍යයෙන්ම වැදගත්වන පාර්ශවද මෙහිදී ඉලක්කගත කණ්ඩායමක් බවට පත්ව ඇත. ඒ මෙරටේ මැතිවරණ කළමනාකරණ ආයතනය වන ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාවයි. (අදාළ ඉලක්කගත කණ්ඩායම් මෙම පර්යේෂණ පත්‍රිකාවේ වෙනත් තැනෙක විග්‍රහ කොට ඇත).

## ක්‍රමවේදය:

මෙම පර්යේෂණ වාර්තාව සකස් කිරීමේදී මූලික වශයෙන් ගුණාත්මක (qualititative) සහ සංඛ්‍යාත්මක (quantitative) යන දෙයාකාරයෙන්ම දත්ත රැස් කිරීම සහ විවරණය කිරීම සිදුකර ඇත. ඊට අමතරව පහත දක්වා ඇති ක්‍රමවේද කෙරෙහිද වැඩි අවධානයක් යොමුකොට ඇත.

- අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳව දේශීයව සහ ජාත්‍යන්තරව ලියැවී ඇති පර්යේෂණ පත්‍රිකා, පුවත්පත් මෙන්ම සඟරා වාරික, ජර්නල් විශේෂාංග, සහ කෘති, සම්මන්ත්‍රණ සටහන්, මැතිවරණ නිරීක්ෂණ සංවිධාන අවසන් වාර්තා, මැතිවරණ කළමනාකරණ ආයතන මඟින් නිකුත් කොට ඇති අන්තර්කාලින සහ අවසන් වාර්තා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ අනෙකුත් අදාළ අනපනත්, ආදිය කෙරෙහි වෙසෙස් අවධානයක් යොමුකරමින් මූලික පසුබිම් වාර්තාවක් සැකසීම

- ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා (Focus Group Discussions -FGD s) පැවැත්වීම

- අදාළ විෂය ක්ෂේත්‍රයෙහි වඩාත් ප්‍රායෝගිකව නිරත මෙන්ම න්‍යායාත්මක පරිචයක් සහිත පිරිස් සමඟ සිදුකරන සම්මුඛ සාකච්ඡා/සංවාද

- මූලික කරුණුවලින් සමන්විත ඉදිරිපත් කිරීමක් ආශ්‍රයෙන් සහභාගික අදහස් ලබාගැනීම

මේ අනුව පහත සඳහන් දින සාකච්ඡා සහ ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා පැවැත්විණ

- කටුනායක -බියගම ප්‍රමුඛ දිවයිනේ පිහිටි සමස්ත ආයෝජන කලාප නියෝජනය වන පරිදි ඇරයුම් ලබා පැමිණි වෘත්තීය සමිති, කාන්තා සංවිධාන සහ සිවිල් සමාජ සංවිධාන ප්‍රමුඛ නියෝජිතයන්ගෙන් සැදුම්ලත් පිරිසක් හා කටුනායකදී පවත්වන ලද සාකච්ජාව. මෙම සාකච්ජාව වසර 2022 ඔක්තෝබර් මස 22 වැනි දින සහභාගිකයන් 35 දෙනෙකුගේ එක්වීමෙන් පැවැත්විණි.

- මීගමුව සහ ඒ අවට සමස්ත ධීවර ප්‍රජාව නියෝජනය වන පරිදි ඇරයුම් ලබා පැමිණි ධීවර සමිති, වෘත්තීය සමිති, කාන්තා සංවිධාන සහ සිවිල් සමාජ සංවිධාන, ප්‍රමුඛ සමාජ ක්‍රියාධරයන්ගෙන් සැදුම්ලත් පිරිසක් හා මීගමුවේදී පවත්වන ලද සාකච්ජාව. මෙම සාකච්ජාව නොවැම්බර් මස 22 වැනි දින (සෙනසුරාදා) මීගමුවේ හේඩ් ආයතන පරිශ්‍රයේදී සහභාගිකයන් 25 දෙනෙකුගේ සහභාගිත්වයෙන් පැවැත්විණි.

- ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමේ සිවිල් සමාජ සංවිධාන, වෘත්තීය සමිති, රාජ්‍ය නොවන සංවිධාන, වෘත්තීය මාධ්‍ය සංවිධාන සහ වෘත්තීය මාධ්‍යවේදීන්, මැතිවරණ නිරීක්ෂණ සංවිධාන ඇතුළු වෙනත් සමාජ සංවිධාන නියෝජිතයන්ගෙන් සැදුම්ලත් සභාවක් වෙත පර්යේෂණය මඟින් නිරීක්ෂණයට සහ අනාවරණයට බඳුන් වූ දත්ත ඉදිරිපත් කිරීම සහ ප්‍රතිචාර ලබාගැනීම. එකී හමුව 2022 නොවැම්බර් මස 04 වැනි දින (සිකුරාදා) සහභාගිකයන් 22 කගේ දායකත්වයෙන් පැවැත්විණි.

# පර්යේෂණයේ සීමාවන්:

මෙම පර්යේෂණයෙහි වෙසෙස් ලක්ෂණය වන්නේ මෙරටේ මෙතෙක් තම ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ පුද්ගලයන් සහ පාර්ශව පිළිබඳ පුළුල් සමීක්ෂණයක් සිදු කරන පළමු අවස්ථාව වීමයි. වරින්වර යම්යම් පර්යේෂණ සහ වාර්තා එළිදැක්වා තිබුණද එහිලා අදාළ සියළු පාර්ශව එක්කරගත් පිළිවෙතක් අනුගමනය කොට තිබූ බවක් නොපෙනේ. ඒ අනුව වඩාත් ප්‍රමුඛතම අභියෝගය බවට නිතැතින්ම පත්වූයේ අදාළ පිරිස් කෙතරම් සංඛ්‍යාත්මක පරාසයක සිටින්නේද යන්න හඳුනා ගැනීමයි. බොහෝ පාර්ශව/කණ්ඩායම් පිළිබඳ නිශ්චිත සංඛ්‍යාලේඛන පවත්වා ගැනීමක් හෝ යාවත්කාලීන කිරීමක් සිදු නොවීම එහි වඩාත් අභියෝගාත්මක ඉසව්වයි.

අනෙක් පසින් මෙකී පිරිස් පිළිබඳ නිබඳ අවධානයකින් පසුවිය යුතු මතිවරණ කොමිෂන් සභාව සංඛ්‍යා සහ දත්ත කෙරෙහි සුවිශේෂී අවධානයකින් කටයුතු කරන්නේදැයි යන්නද සැකසහිතය. අදාළ ප්‍රධාන වෙබ් අඩවියෙහි අවශ්‍යයෙන්ම යාවත්කාලීන කලයුතු තොරතුරු සමුදායක් යාවත්කාලීන නොකර තිබීමත්, දැනටමත් තමන් සතුව පවත්නා තොරතුරු නිසි වර්ගීකරණයකට ලක් නොකිරීමත් එහිලා දිස්වූ දුර්වලතාය.

අනෙක් පසින් බොහෝ තොරතුරු ප්‍රමාණයක් එක්රැස් කිරීමට සිදුවූයේ අදාළ රජයේ ආයතන වෙත ලිපි ඉදිරිපත් කිරීමෙනි. එකී ලිපි සඳහා ප්‍රතිචාර නොලැබෙන අවස්ථාවලදී තොරතුරු දැනගැනීමේ පනත් ප්‍රකාර තොරතුරු ඉල්ලා අයදුම්පත් ඉදිරිපත් කෙරිණි. එහෙත් එකී ලිපි හෝ අයදුම්පත් මෙන්ම පෞද්ගලිකව හමුවී තොරතුරු ලබාගැනීමට උත්සහ කල අවස්ථා බොහොමයක්ම වැළකී ගියේය. ඊට බොහෝසෙයින් හේතු වූයේ අදාළ ආයතන තොරතුරු අනාවරණයෙහිලා දක්වන අනවධානයයි. තවද ජාතික ආරක්ෂාව හෝ වෙනත් බැලු බැල්මට අදාළ නොවේයැයි නිරීක්ෂණය කළ හැකි හේතු දැක්වූ අවස්ථාවද නැත්තේ නොවේ. ඊට ප්‍රතිචාර ලෙස තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීමට ඉඩප්‍රස්ථා පැවතියද පර්යේෂණය උදෙසා සිදුකල යුතු අනෙක් කාර්යයන් පිළිබඳව සළකා බැලීමේදී එලෙස තොරතුරු ආයාචනා කිරීමට හෝ හඹා යාමට අවස්ථාවක් නොලැබිණි.

ජාතික වශයෙන් තොරතුරු/දත්ත මත පාදක සංවර්ධන මොඩලයේ පවත්නා ආවේනික දුබලතා මෙහිදී මනාව ඉස්මතු වන බවද දැක්වීම යුක්ති යුක්තය. මැතිවරණ කළමනාකරණය උදෙසා නව මාධ්‍ය මෙන්ම අන්තරජාල යෙදවුම් යොදාගැනීමේ ඇති මැලිකම මෙහි පවත්නා අනෙක් බලත් අභියෝගයයි. එවැනි නූතනවාදී ප්‍රවේශයක් තුළ රජයේ ආයතන ගොනුව තිබුණේ නම් අදාළ සංඛ්‍යා දත්ත ලබාගැනීමේ කිසිදු ගැටළුවක් පැණ නොනගී. ඊට සමගාමීව දේශපාලන පක්ෂ තුළ පවත්නා බලවත් නිද්‍රාශීලිත්වය ද මෙම පර්යේෂණය උදෙසා වන නිශ්චිත දත්ත ලබාගැනීමේදී නිරීක්ෂණය වූ තවත් ගැටළුවකි.

ඡන්දදායකයන් සහ මැතිවරණයක ඉහළ ඡන්ද ප්‍රතිශතයක් යනු දේශපාලන පක්ෂ කොන්දේසි විරහිතව තම දායකත්වය ලබාදිය යුතු කරුණක් වුවද අදාළ කිසිදු දේශපාලන පක්ෂයක් එවැනි වැදගත් සහ අත්‍යවශ්‍ය යැයි හැඟෙන තොරතුරු පද්ධතියක් යාවත්කාලීන නොකිරීම මෙරටේ දේශපාලන සංස්කෘතිය තුළ පවත්නා බලවත් අඩුවකි. එබැවින් දේශපාලන පක්ෂ වෙතින් ලබාගත හැකිවෙතැයි අපේක්ෂිතව පැවති තොරතුරු හෝ ලබාගත් තොරතුරු වඩාත් තහවුරු කරගැනීමේ ක්‍රියාවලිය අඩපණ වූ බවද සටහන් කල යුතුය.

මෙහිලා සටහන් කල යුතු අනෙක් වැදගත් කරුණ නම් අදාළ සමීක්ෂණ දත්ත ලබාගැනීමේ කාර්යයෙහිදී ඉස්මතුවූ ආකල්පමය පසුබිමයි. ආබාධ සහිත පුදගලයන්ගේ කටයුතු පිළිබඳව වෙසෙසින්ම විමසීමේදී ලොව දැනට පවත්නා ජාත්‍යන්තරමය ලෙස පිළිගත් ප්‍රවේශය වන්නේ අයිතීන් පාදක ප්‍රවේශයයි. එහෙත් මෙරටේ එවැනි තත්වයක් දිස් නොවීම නිසා ඔවුන්ගේ ඡන්ද අයිතියද අවශ්‍යයෙන්ම පැවතිය යුතු අයිතියක් ලෙස දේශපාලන සහ පොදුවේ මැතිවරණ පාර්ශවකරුවන් අතර නිසිලෙස ඉස්මතුව නොමැත.

පූර්ව ඡන්ද ප්‍රභේද යන්න කවරක් දැයි වඩාත් පහසුවෙන් අවබෝධ කරගැනීම සඳහා පහත සඳහන් වගුව උපයෝගී කරගත හැකිය. Absantee Voting සහ Early voting සඳහා අනුදත් ක්‍රමවේද එහි අන්තරගතය.


| තාවකාලික හේතූන් මත මැතිවරණ දින පැමිණීමට අපහසු පිරිසේ ඡන්ද භාවිතය | පූර්ව හෙවත් සාර්වත්‍රික ඡන්ද භාවිතය |
|---|---|
| ඡන්දය පැවැත්වෙන සාමාන්‍ය කාල සීමාවන් තුළ අදාළ නගරයේ රැඳී නොසිටීම හෝ යම් ශාරීරික ආබාධයක් /ආගමික විශ්වාසයක් මත ඡන්ද භාවිතය සඳහා පැමිණීමට අපහසුතා ඇති පිරිස් | මැසචූසෙට්ස්හි සියළු ලියාපදිංචි ඡන්දදායකයන් තම ඡන්දය ප්‍රකාශ කල යුත්තේ ඔබ ලියාපදිංචි වූ නගරයේදීය<br><br>පෞද්ගලිකව ඡන්ද ප්‍රකාශ කරන විටෙකදී අයදුම්පතක් අවශ්‍ය නොවේ |
| එකම ගෘහයේ වාසය කරන සාමාජිකයෙක් හට ලියාපදිංචි ඡන්දහිමියෙක් වෙනුවෙන් මැතිවරණ දින පැමිණීමට නොහැකි තැනැත්තන් සඳහා පිරිනමන ඡන්ද හිමිකම ලබාගැනීම සඳහා ඉල්ලීමක් කල හැකිය<br><br>මැතිවරණ දින පැමිණීමට නොහැකි තැනැත්තන් සඳහා පිරිනමන ඡන්ද හිමිකම හැමවිටම ලබාදෙනු ලබන්නේ අදාළ තැනැත්තාගේ ඉල්ලීමක් මතය. එවැන්නක් සඳහා අයදුම්පතක් හෝ ලිපියක් මඟින් ඉල්ලීමක් කල හැකිය<br>යම් ඉල්ලීමක් ලද විගස ඡන්ද පත්‍රිකා තැපෑලට යොමුකරනු ඇත | පූර්ව ඡන්ද පත්‍රිකාවක් තැපෑලෙන් ගෙන්වා ගැනීම සඳහා ලිඛිත ඉල්ලීමක් කල හැක්කේ ඡන්දදායකයාට පමණි<br><br>පූර්ව ඡන්ද අයදුම්පත් භාරදීම පූර්ව ඡන්ද සඳහා වන කාල සීමාවට මෙපිටින් සිදුකල යුතුය<br><br>ඔබගේ පූර්ව ඡන්ද භාවිතය සඳහා ඔබම ඉල්ලීම කිරීමට කාරුණික වන්න<br>පූර්ව ඡන්ද කාලසීමාව ආරම්භ වීමෙන් අනතුරුව ඡන්ද පත්‍රිකා තැපෑලට යොමුකරනු ලැබේ. |
| නගරයෙන් නික්මීමට ප්‍රථම කාර්යාලය තුළදී තම ඡන්දය භාවිත කල හැකිය | අදාළ කාල සීමාව තුළ ඡන්දය භාවිත කිරීමට හැකිය |



# ඡන්දදායකයන්ගේ අඛණ්ඩ මැතිවරණ සහභාගිත්වය

කලාපයේ වෙනත් රාජ්‍යය හා සසඳා බැලීමේදී මෙරටේ ඡන්දදායක මැතිවරණ සහභාගිත්වය ඉතා විශිෂ්ඨ එකකි. සර්වජන ඡන්ද බලය ලත් දිනයේ පටන් මෙරටේ පවත්වා ඇති සියළු ආකාරයේ මැතිවරණ සංඛ්‍යාව 74 ක් වන අතර එකී මැතිවරණ සඳහා දක්වා ඇති ඡන්දදායක සහභාගිත්වය ද අනගිභවනීයය.


ජාතික මට්ටමේ මැතිවරණ පිළිබඳව සළකා බැලීමේදී වැඩිම ඡන්ද ප්‍රතිශතයක් වාර්තා වී ඇති ලොව ප්‍රමුඛ රටවල් පහත දැක්වේ.



ඉහත වගුව මඟින් දක්වන තොරතුරු සහ සංඛ්‍යා දත්ත ආශ්‍රයෙන් පැහැදිළිව පෙනී යන්නේ රුවන්ඩාව ඉහළ ඡන්ද ප්‍රතිශතයක් වාර්තා කරන රට බවට පත්ව ඇති බවයි. ඇමෙරිකා එක්සත් ජනපදයද ඇතුළත්ව ලොව බොහෝ සංවර්ධිත රාජ්‍යය තුළින් එතරම් ඉහළ ඡන්ද ප්‍රතිශතයක් වාර්තා නොවීම ද විශේෂත්වයකි. නිදසුනක් ලෙස ඇමෙරිකා එක්සත් ජනපදය පිළිබඳව සළකා බැලීමේදී තහවුරු වන්නේ වසර 2020 පැවති ජනාධිපතිවරණයේදී මිලියන 158 ක පමණ ඡන්දදායකයන් පිරිසක් තම ඡන්දය භාවිත කරනු ඇතැයි උපකල්පනය කරන ලද අතර ප්‍රතිශතාත්මකව 66.5% ප්‍රතිශතයක පිරිසක් පමණක් තම ඡන්දය ප්‍රකාශ කොට තිබූ බවයි. කෙසේවුවත් එය එරටේ මැතිවරණ ඉතිහාසයෙහි වාර්තාවකි. වසර 1900 න් අනතුරුව එවන් ආකාරයේ ඉහළ ඡන්ද ප්‍රතිශතයක් එරටේ වාර්තාවූ පළමු අවස්ථාව වූයේ එයයි.

**Minimum voting age is 18 in most countries and territories**

*Number of countries and territories where the minimum voting age in national elections is __ years old*




Note: Data available for 237 countries and territories.
Source: ACE Electoral Knowledge Network database. Accessed October 2020.

PEW RESEARCH CENTER

ඊට සමගාමීව මෑත කාලීනව ලෝක පරිමාණයෙන් පැවති මැතිවරණ තුළ ඉතා අඩු ඡන්ද ප්‍රතිශතයක් වාර්තා වූ ජාතික මට්ටමේ ඡන්ද පැවැත්වූ රටවල් අතර ප්‍රමුඛ වන්නේ හයිටිය, ඇෆ්ඝනිස්ථානය වැනි රටවල්ය. එකී රටවල සමාජ දේශපාලන පසුබිම විග්‍රහ කිරීමේදී එසේ වන්නේ මන්දැයි වටහා ගැනීමද අපහසු නැත. පශ්චාත් යුධමය වාතාවරණයකදී සැබෑ මහජන උද්‍යෝගයකින් යුත් මැතිවරණ අපේක්ෂා කිරීම එතරම් පහසු නැත.

## Top 10 Countries with the Highest Voter Turnout:*

| Rank | Country | Election Type & Year | Turnout (%) |
|---|---|---|---|
| 1 | Rwanda | 2017 Presidential | 98.15 |
| 2 | Laos | 2021 Parliamentary | 98.02 |
| 3 | Turkmenistan | 2022 Presidential | 97.17 |
| 4 | Singapore | 2020 Parliamentary | 95.81 |
| 5 | Vietnam | 2021 Parliamentary | 95.60 |
| 6 | Nauru | 2019 Parliamentary | 95.13 |
| 7 | Ethiopia | 2021 Parliamentary | 93.64 |
| 8 | Equatorial Guinea | 2016 Presidential | 92.70 |
| 9 | Togo | 2020 Presidential | 92.28 |
| 10 | Antigua and Barbuda | 2014 Parliamentary | 90.27 |

| ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මැතිවරණ ඉතිහාසය 1947 - 2020 | | | | | |
|---|---|---|---|---|---|
| මැතිවරණය | ලියාපදිංචි ඡන්දහිමියන් සංඛ්‍යාව | ප්‍රකාශිත මුළු ඡන්ද සංඛ්‍යාව | ප්‍රකාශිත ඡන්ද ප්‍රතිශතය | ප්‍රතික්ෂේපිත ඡන්ද සංඛ්‍යාව | ප්‍රතික්ෂේපිත ඡන්ද සංඛ්‍යාවේ ප්‍රතිශතය |
| *තනි පුද්ගල බහුතර කේවල කොට්ඨාශ ක්‍රමය යටතේ* | | | | | |
| 1947 | 3,048,145 | 1,710,150 | 56.10% | 44,570 | 2.61% |
| 1952 | 2,990,912 | 2,114,615 | 70.70% | 37,552 | 1.78% |
| 1956 | 3,464,159 | 2,391,538 | 69.04% | 30,683 | 1.28% |
| 1960 (March) | 3,724,507 | 3,041,420 | 81.66% | 32,040 | 1.05% |
| 1960 (July) | 3,724,507 | 3,076,869 | 82.61% | 22,225 | 0.72% |
| 1965 | 4710887 | 3,821,918 | 81.13% | 33,234 | 0.87% |
| 1970 | 5,505,028 | 4,991,798 | 90.68% | 25,828 | 0.52% |
| 1977 | 6,667,589 | 6,243,573 | 93.64% | 32,989 | 0.53% |
| *සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ* | | | | | |
| 1989 | 9,374,164 | 5962031 | 63.60% | 365,563 | 6.13% |
| 1994 | 10,945,065 | 8,344,095 | 76.24% | 400,389 | 4.80% |
| 2000 | 12,071,062 | 9,128,823 | 75.63% | 481,155 | 5.27% |
| 2001 | 12,428,762 | 9,449,813 | 76.03% | 493,944 | 5.23% |
| 2004 | 12,899,139 | 9,797,680 | 75.96% | 534,948 | 5.46% |
| 2010 | 14,088,500 | 8,630,689 | 61.26% | 596,972 | 6.92% |
| 2015 | 15,044,490 | 11,684,098 | 77.66% | 517,123 | 4.43% |
| 2020 | 16,263,885 | 12,343,392 | 75.89% | 744,373 | 6.03% |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව*

# විකල්ප ඡන්ද භාවිත කිරීමේ ක්‍රම
# Advance Voting

Advance Voting යන්නට බැලූ බැල්මට දියහැකි පදගත අර්ථය පූර්ව ඡන්ද භාවිතයයි. එහෙත් මෙහිදී සාකච්ජාවට බඳුන් කරන විෂය ක්ෂේත්‍රය පුරව ඡන්ද නමින් හැදින්වෙන පරාසයට ඔබ්බෙන් පිහිටි එකකි. පොදුවේ පූර්ව ඡන්ද ක්‍රමයක් තුළ සිදුවන වඩාත් ප්‍රකට සංසිද්ධිය වන්නේ මැතිවරණය පැවැත්වෙන දිනට පෙර තම ඡන්දය භාවිත කිරීම සඳහා යම් අවස්ථාවක් ලබාදීමයි. එහෙත් මෙම පර්යේෂණ පත්‍රිකාව තුළදී සාකච්ජාවට බඳුන් කරන එක් තේමාවක් වන්නේ අදාළ ඡන්දදායකයන් හට යම් මැතිවරණයක් පැවැත්වෙන දිනයේදී ද ඡන්දය භාවිතයට අදාළ අවස්ථා පිළිබඳ සොයා බැලීමයි. එනයින් මෙවැනි මැතිවරණ ක්‍රමයකදී භාවිත නාමකරණ වන අප්‍රාප්තික හෝ සාර්වත්‍රික යන හැඳින්වීම් එතරම් ගෝචර නොවන බව පෙනී යයි. එබැවින් වඩාත් සුහුරු හෙවත් ගැලපෙන නාමකරණය ලෙස විකල්ප ඡන්ද භාවිතය මෙතැන් සිට මෙම වාර්තාව තුළ අන්තර්ගතය.

ලොව ඕනෑම මැතිවරණ ක්‍රමයක් ඊට අදාළ සමාජ හා දේශපාලන ප්‍රවණතා හමුවේ වෙනස්වීම්වලට ලක් වන්නේය යන්න උදෙසා වන සනිදර්ශනාත්මක ප්‍රවේශයක් වන්නේ පූර්ව ඡන්ද භාවිතය හා සබැඳි ප්‍රවණතා සමුදායයි. තවද මැතිවරණ ක්‍රියාවලියක ඡන්ද භාවිතය යනු සුවිසල් ප්‍රවර්තන මැදිහත්වීමක තීරණාත්මකම අවස්ථාවයි. එබැවින් ඊට ලොව සෑම ප්‍රජාතන්ත්‍රීය ජන සමාජයකම දී ඇත්තේ බලවත් වටිනාකමකි.

# සම්ප්‍රදායික ඡන්ද භාවිතය

ඡන්ද භාවිතයේ සම්ප්‍රදායික ප්‍රවේශය මුළුමනින්ම මානව සම්පත උපයෝගී කරගනිමින් සිදුවන්නකි. ඡන්දහිමියෙක් ලෙස ගණන් ගන්නා (ඍකැජඑදර) නැමැත්තා ඡන්දදායකයෙක් බවට (ඞදඑැර) පරිවර්තනය වීම පූර්ව ඡන්ද සමයේ සිදුවන්නකි. . එහිදී මැතිවරණ දිනයේදී ඡුන්දදායකයන් ඡුන්දය භාවිත කරනු ලබන අතර ඊට සමගාමීව වෙනත් ක්‍රමවේදයක් ක්‍රියාවට නොනැඟේ. එසේ වුවත් මෑත කාලීනව මතුවූ කොවිඩ් 19 ව්‍යසනය වැනි ලෝක මට්ටමේ ආපදාමය තත්වයක් අභියස පූර්ව ඡන්ද කෙරෙහි ඇති ආශක්තබව ද වැඩිවෙමින් පැවතීම ද විශේෂත්වයකි.

## ද්විවිධ විකල්ප ඡන්ද ක්‍රම භාවිත කිරීමේ ප්‍රවේශ

විකල්ප ඡන්ද ක්‍රම භාවිතය පිළිබඳව විමසා බැලීමේදී මනාව පැහැදිළි වන කරුණක් නම් එය දෙයාකාර ප්‍රවේශයක් ගන්නා බවයි.

01. තැපැල් ඡන්ද - Postal Voting
02. අප්‍රාප්තික හෙවත් නිශ්චිත දිනයේ නොපැමිණෙන - Advance Voting



# නෛතික පසුබිම

විකල්ප ඡන්ද ක්‍රම භාවිතයට අදාළව ශ්‍රී ලාංකේය මැතිවරණ නීතිය තුළ පුළුල් නිර්වචනයක් නොදැක්වේ. එය මුළුමනින්ම සම්ප්‍රදායික ප්‍රවේශයේ නෛතික එළඹුමකි. ඒ අනුව මෙරටේ පවත්නා මැතිවරණ නිති ප්‍රකාරව, විකල්ප ඡන්ද ක්‍රම භාවිතයේ විධික්‍රම දෙකක් පැහැදිළිව හඳුනා ගත හැකිය. ඒ මෙලෙසය.

01. තැපැල් ඡන්ද භාවිතය

02. ඡන්ද මධ්‍යස්ථානය වෙනස් කිරීම

## 01. තැපැල් ඡන්ද භාවිතය

ඡන්ද විමසීමකදී එම ක්‍රියාවලිය සඳහා මැතිවරණ කොමිෂන් සභාව, පොලීසිය සහ රාජ්‍ය නිලධාරීගේ සුසංයෝග අත්‍යවශ්‍ය වේ. මෙහිදී ඡන්ද විමසීම් දිනයේ මැතිවරණ රාජකාරීවල හා ඒ හා ආශ්‍රිත ක්‍රියාකාරකම් වල යෙදීම නිසා එම තැනැත්තන්ට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අවස්ථාවක් නොලැබේ. මේ නිසා එවැනි තැනැත්තන්ට ඡන්ද විමසීම් දිනට පූර්වයෙන් තැපැල් මඟින් ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා මැතිවරණ නීති මඟින් අවකාශ සළසා ඇත. මේ සඳහා විධි විධාන,

I. 1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත

II. 1981 අංක 07 දරන ජනමත විචාරණ පනත

III. 1981 අංක 15 දරන ජනාධිපති තෝරා පත්කර ගැනීමේ පනත

IV. 1981 අංක 02 දරන පළාත් සභා ඡන්ද විමසීමේ පනත සහ

V. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ (262 වන අධිකාරය) ඇතුළත්ව ඇත.

සමහර රටවල මේ සඳහාජන්ද විමසීම් දිනට පූර්වයෙන්, පූර්වජන්ද මධ්‍යස්ථාන ඇති කිරීම වැනි ක්‍රමවේද යොදා ගත්ත ද ශ්‍රී ලංකාවේ මැතිවරණ නීතිය තුළ ඒ සඳහා තැපෑලෙන් ජන්දය ප්‍රකාශ කිරීමේ ක්රක්‍රමවේදය භාවිතා වේ. තැපැල් ජන්ද හිමිකම් ඇති තැනැත්තන් පිළිබඳව මැතිවරණ නීතියේ සඳහන් වන අතර, 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ජන්ද විමසීමේදී පහත සඳහන් ගණයන්ට තැපැල් ජන්ද හිමිකම් ඇති බව දැක්වේ.

- ශ්‍රී ලංකා යුධ හමුදාවේ සාමාජිකයකු
- ශ්‍රී ලංකා නාවික හමුදාවේ සාමාජිකයකු
- ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකු
- ශ්‍රී ලංකා පොලීසියේ නිලධරයකු හෝ සේවකයකු
- බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිළධරයකු හෝ සේවකයකු
- ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධරයකු හෝ සේවකයකු
- තැපැල් දෙපාර්තමේන්තුවේ නිළධරයකු හෝ සේවකයකු
- විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ නිළධරයකු හෝ සේවකයකු
- ශ්‍රී ලංකා මධ්‍යම ගමනා ගමන මණ්ඩලයේ නිලධරයකු හෝ සේවකයකු
- ප්‍රාදේශීය ගමනා ගමන මණ්ඩලයක නිලධරයකු හෝ සේවකයකු

තම සේවා නියුක්තියේ විශේෂ කටයුතු හේතු කොටගෙන පෞද්ගලිකව තමාට වෙන් කරන ලද ජන්ද පොළේ ජන්දය දීමට නොහැකි වීම හෝ නොහැකි වීමට ඉඩ තිබීමේ හේතුව මත රජයේ සේවයේ හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ හෝ පළාත් පාලන සේවයේ වෙනත් යම් නිලධරයකු හෝ සේවකයකු ජන්ද විමසීම් පවත්වන දිනයේ තෝරා පත් කර ගැනීමේ කටයුතු සඳහා කාර්යය සඳහා සේවයේ නියුක්ත කරනු ලැබීමට ඉඩ තිබීමේ හේතුව නිසා

මැතිවරණ දිනයේදී නොයෙක් අපහසුතා මත මෙරටේ ජන්දය ලබාදීමට නොහැකිවන පිරිස් සඳහා දැනට පවත්නා තැපැල් ජන්ද ක්‍රමය වඩාත් විස්තාරණය කිරීම යෝග්‍ය බව බොහෝ මැතිවරණ විශ්ලේෂකයන්ගේ අදහසයි. එහෙත් මැතිවරණ බළධාරීන් දරන්නේ ඊට ප්‍රතිපක්ෂ අදහසකි. ඊට දරන්නට සිදුවන පිරිවැය සළකා බැලීමේදී කාලීනවචිහි යම් නොගැලපීමක් ඇති බව ඔවුන්ගේ අදහසයි. කෙසේවෙතත් මෙරටේ අනාදිමත් කලෙක පටන් පවත්නා අදහසක් වන්නේ තැපැල් ජන්ද ලබාදීමද යම් වරප්‍රසාදයක් බවත් එය අත්‍යවශ්‍ය පිරිස් සදහා ලබා නොදීම එක්තරා ආකාරයක අසාධාරණයක් බවත්ය.

මෙම කරුණ පිළිබඳව මෙම පර්යේෂණ පත්‍රිකාවේ තැනෙක ප්‍රමාණවත් අවධානයක් යොමුකොට ඇත. ඊට වැඩිමනත් වශයෙන් ශ්‍රී ලංකාවේ තැපැල් ජන්ද ක්‍රියාවලිය පිළිබඳව වැඩිදුර කියවීමට පැෆ්රල් සංවිධානය මඟින් ප්‍රකාශිත පහත සඳහන් පර්යේෂණ පත්‍රිකාව කියවීම වඩාත් සුදුසුය.

ශ්‍රී ලංකාවේ තැපැල් ජන්ද ක්‍රියාවලිය පිළිබඳ විග්‍රහයක්:තැපැල් ජන්ද අයදුම්පත් ප්‍රතික්ෂේප වීම හා හා සබැඳි පසුබිම විමසීම හා අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීම 2022, මංජුල ගජනායක, පැෆ්රල් පර්යේෂණයක්

මෙම ජන්ද භාවිතය තුළ වෙසෙසින් වැදගත් වන්නේ තමන් ප්‍රෝත්සාහිව ඊට ඉල්ලුම් කිරීමයි.

තවද එහිලා භාවිත ක්‍රමවේද ද ද විවිධාකාරය. එමෙන්ම එකකට එකක් නොදෙවෙනි පරිපාටින් ද ක්‍රියාවට නැඟේ. ස්වීඩනය, නෝර්වේ, සහ ඩෙන්මාර්කය වැනි රටවල බහුලව භාවිත කරනු ලබන්නේ තැපැල් මාර්ග යෙන් අදාළ ජන්ද හිමියා වෙත ජන්ද කාර්ඩ්පත යැවීමයි. පසුව අදාළ කාර්යාලයෙන් ජන්ද පත්‍රිකාව ලබාගැනීමේ හැකියාව පවතී.
තවත් රටවල තමන් විසින් නම්කරනු ලබන අනුප්‍රාප්තිකයෙක් (Proxy) මඟින් ජන්ද පත්‍රිකාව ලබාගත හැකිය.

මෙවැනි ක්‍රමවේදයකදී වඩාත් ඉලක්කගතව ඇත්තේ ආබාධ සහිත ජන්දදායකයන් පිරිසයි. තවද මෙකී ජන්දක්‍රමයේ පවත්නා වඩාත් සුවිශේෂත්වයක් නම් ලොව සමහර රටවල් ඔනෑම ජන්දදායකයෙක් සඳහා අදාළ ජන්ද පහසුකම ලබාදීමයි. ඊට නිදසුන් වන්නේ ඇමෙරිකා එක්සත් ජනපදයේ සමහර ප්‍රාන්ත (States) , ජර්මනිය සහ ලක්සම්බර්ග් වැනි රාජ්‍යයයි.. දකුණු කොරියාව, ස්වීඩනය, ඕස්ට්‍රිලියාව, ලිතුවේනියා, වැනි රාජ්‍යය අනුදත් ක්‍රමවේදය ද ද සුවිශේෂී වේ. එනම් අදාළ ජන්ද පොළට ප්‍රවේශය අපහසු හෝ දිගු දුරක් පවතින්නේ නම් වේලාසන ඉල්ලුම් කිරීමෙන් අනතුරුව එකී පහසුකම ලබාගැනීමයි. තවද ජපානය වැනි රටක් අනුගමනය කරනු ලබනක්‍රමවේදය වන්නේ තැපෑලෙන් ජන්ද පහසුකම ලබාදීම ආබාධ සහිත ප්‍රජාවට පමණක් වෙන්කොට තිබීමයි.

පිළිගත් වෛද්‍යවරයෙක් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයකට පමණක් තැපැල් ඡන්ද භාවිතයේ අවස්ථාව ලබාදෙන අතර ඉන්දියාව සහ පාකිස්ථානය රජයේ සේවකයන්ට පමණක් එකී අවස්ථාව ලබාදී ඇත.තවද ඕස්ට්‍රේලියාව තම වැඩබිම් හා කම්හල් සේවය තුළ ඡන්ද භාවිතයට අපහසු තැනැත්තන් උදෙසා ද තැපැල් ඡන්ද භාවිතය සඳහා අවකාශ ලබා දී ඇත. ඇමෙරිකා එක්සත් ජනපදයේ ප්‍රාන්ත 17 ක් පමණ මීට අදාළ අයදුම්පත් මාර්ගගත ක්‍රමය ඔස්සේ ලබාගැනීමේ පහසුකම් ලබාදී ඇති බවද සඳහන් කිරීම මෙහිලා වැදගත්ය.

**තැපැල් ඡන්ද ප්‍රතික්ෂේප වීමේ හේතු**

| දිස්ත්‍රික්කය සහ අයදුම්පත් සංඛ්‍යාව | ඡන්ද රාජකාරී සඳහා යෝග්‍ය නොගැනීම | තැපැල් ඡන්ද හිමිකම නොමැතිවීම | අයදුම්කරුගේ අත්සන තබා නොමැතිවීම | අයදුම්කරුගේ තනතුර සඳහන් නොකිරීම | සහතික කිරීමේ නිලධාරියා විධිමත්ව සහතික කොට නොමැතිවීම (අත්සන /නිලමුද්‍රාව නොමැති අවස්ථා ඇතුළත්ව) අයදුම්පත ප්‍රමාදවී ලැබීම | අදාළ වර්ෂයේ භාවිත ඡන්දහිමි නාම ලේඛනයේ ලියාපදිංචි නොවීම | ඡන්ද කොට්ඨාශයේ අංකය සහ අනුක්‍රමික අංකය ප්‍රධාන අකාරයෙන් නොකරුර නිසිලෙස සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් | වෙනත් |
|---|---|---|---|---|---|---|---|---|
| ගම්පහ - 20 | 01 | 01 | 02 | 01 | 04 | 01 | 10 | |
| යාපනය - 20 | 01 | 01 | 02 | 01 | 02 | 05 | 08 | |
| මහනුවර - 20 | 01 | 01 | 02 | 02 | 02 | 02 | 09 | 01 |
| හම්බන්තොට - 20 | 03 | | 02 | 01 | 02 | 01 | 11 | |
| නුවරඑළිය - 20 | 03 | 01 | 03 | 03 | 04 | | 06 | |
| කෑගල්ල - 20 | | | 01 | 03 | 03 | 02 | 09 | 02 |
| කුරුණෑගල - 20 | 02 | 02 | 02 | 02 | 04 | 02 | 02 | 04 |
| බදුල්ල - 20 | 01 | 01 | 02 | 01 | | | 15 | |
| **එකතුව - 160** | **12** | **07** | **16** | **14** | **21** | **13** | **70** | **07** |

මංජුල ගජනායක විසින් සම්පාදිත, පැෆ්රල් සංවිධානය මඟින් ප්‍රකාශිත ශ්‍රී ලංකාවේ තැපැල් ඡන්ද ක්‍රියාවලිය පිළිබඳ විග්‍රහයක්: තැපැල් ඡන්ද අයදුම්පත් ප්‍රතික්ෂේප වීම හා සබැඳි පසුබිම විමසීම හා අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීම, යන අධ්‍යයනයෙනි

## 02. ඡන්ද මධ්‍යස්ථානය වෙනස් කිරීම

පූර්ව ඡන්ද ක්‍රියාවලිය පිළිබඳව සළකා බැලීමේදී මෙරටේ දක්නට ලැබෙන එවැනි ආකාරයේ දෙවැනි අවස්ථාව වන්නේ යම් ඡන්දදායකයෙක් හට තම ඡන්ද මධ්‍යස්ථානය වෙනස් කිරීම සඳහා ලැබෙන අවස්ථාවයි. ශ්‍රී ලංකාවේ මෙවැනි මැතිවරණ නීතියක් ප්‍රභවය ලැබීමට හේතු වී ඇත්තේ මෙරටේ කලින් කල පැවති දේශපාලන නොසංසුන්තා මැද්දේ අදාළ ඡන්දදායකයන් හට තම ඡන්දය බියෙන් සැකෙන් තොරව ප්‍රකාශ කිරීමට අවස්ථාව සැළසීම සඳහාය.

### අදාළ නීති ප්‍රතිපාදන:

"වෙනත් යම් නීතියක කුමක් සඳහන්ව ඇතද, තමාගේ ඡන්ද පොළ පිහිටි ප්‍රදේශයේ පවතින තත්වය හේතුකොට ගෙන එම ඡන්ද පොළේදී තමාගේ ඡන්දය දීමට නොහැකි වෙතැයි සාධාරණ බියක් ඇති යම් ලියාපදිංචි ඡන්දහිමියෙකු විසින්, තමාගේ ඡන්දය කොමසාරිස්වරයා විසින් ඔහුගේ පරම අභිමතය පරිදි තීරණය කරනු ලබන්නා වූ වෙනත් ඡන්ද පොළකදී දීමට අවසර දෙන ලෙස ඉල්ලමින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත ඉල්ලුම්පත්‍රයක්, නාම යෝජනා දැන්වීමෙන් එක් සතියක් ඇතුළතදී ඉදිරිපත් කළ හැකිය". 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 127ආ. (1). (Ref. 1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත)

ඉහත කී 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතට 1988 අංක 15 දරන සංශෝධිත පනතින් සකසන ලද නීතිමය ප්‍රතිපාදන යටතේ තමාගේ ඡන්ද පොළ පවතින ප්‍රදේශයේ පවතින තත්ත්වය හේතුකොට ගෙන එම ඡන්ද පොළේ දී තමාගේ ඡන්දය ප්‍රකාශ කිරීමට දීමට නොහැකි වෙතැයි සාධාරණ බියක් ඇති යම් ලියාපදිංචි ඡන්ද හිමියෙකුට, පනතේ 127 (ආ* වගන්තිය ප්‍රකාරව වෙනත් ඡන්ද පොළකදී ඡන්දය දීමට අවසර දෙන ලෙස ඉල්ලා මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට හැකියාව පවතී.

එවැනි ඉල්ලීමක් නාමයෝජනා දැන්වීම ප්‍රකාශයට පත් කිරීමෙන් සතියක් ඇතුළත කළ යුතු වේ. ඒ අනුව පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයේදී අංක 2165/18 හා 2020.03.03 දිනැති රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ දැන්වීමක් ප්‍රසිද්ධ කරන ලද අතර පුවත්පත් දැන්වීම් හා මාධ්‍ය නිවේදන මගින් ද පුළුල් ප්‍රචාරයක් ලබා දී ඇත.

මෙකී පාර්ලිමේන්තු මැතිවරණයේ දී මෙම පහසුකම ඉල්ලා සිටි, වන්නි මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි වී ඇතත්, තමාට හිමි ඡන්ද පොළට ගොස් ඡන්දය ප්‍රකාශ කිරීමට සාධාරණ බියක් ඇති ඡන්ද හිමියන් සඳහා, ඡන්දය ප්‍රකාශ කිරීමට අංක 16 දරන පුත්තලම මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද පොළවල් වෙන් කර දෙන ලදී. මේ සම්බන්ධයෙන් තොරතුරු අංක 2184/19 හා 2020.07.15 ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද අතර ඊට අදාළ විස්තර අංක 02 දරන සටහනෙහි දැක්වේ. ඊට අමතර වශයෙන් අදාළ ක්‍රියාවලිය සිදුවන ආකාරය පිළිබඳව ඉහත නෛතික ප්‍රතිපාදනයට පසුව සඳහන් වන වගන්ති වල දැක්වේ.

## තාවකාලික හේතූන් මත මැතිවරණ දින පැමිණීමට අපහසු පිරිසේ ඡන්ද භාවිතය

- ඡන්දය පැවැත්වෙන සාමාන්‍ය කාල සීමාවන් තුළ අදාළ නගරයේ රැඳී නොසිටීම හෝ යම් ශාරීරික ආබාධයක් /ආගමික විශ්වාසයක් මත ඡන්ද භාවිතය සඳහා පැමිණීමට අපහසුතා ඇති පිරිස්
- එකම ගෘහයේ වාසය කරන සාමාජිකයෙක් හට ලියාපදිංචි ඡන්දහිමියෙක් වෙනුවෙන් මැතිවරණ දින පැමිණීමට නොහැකි තැනැත්තන් සඳහා පිරිනමන ඡන්ද හිමිකම ලබාගැනීම සඳහා ඉල්ලීමක් කළ හැකිය.
- මැතිවරණ දින පැමිණීමට නොහැකි තැනැත්තන් සඳහා පිරිනමන ඡන්ද හිමිකම හැමවිටම ලබාදෙනු ලබන්නේ අදාළ තැනැත්තාගේ ඉල්ලීමක් මතය. එවැන්නක් සඳහා අයදුම්පතක් හෝ ලිපියක් මගින් ඉල්ලීමක් කළ හැකිය.
- යම් ඉල්ලීමක් ලද විගස ඡන්ද පත්‍රිකා තැපෑලට යොමුකරනු ඇත.
- නගරයෙන් නික්මීමට ප්‍රථම කාර්යාලය තුළදී තම ඡන්දය භාවිත කළ හැකිය.

## පූර්ව හෙවත් සාර්වත්‍රික ඡන්ද භාවිතය

- මැසචුසෙට්ස්හි සියළු ලියාපදිංචි ඡන්දදායකයන් තම ඡන්දය ප්‍රකාශ කළ යුත්තේ ඔබ ලියාපදිංචි වූ නගරයේදීය.
- පෞද්ගලිකව ඡන්ද ප්‍රකාශ කරන විටෙකදී අයදුම්පතක් අවශ්‍ය නොවේ.
- පූර්ව ඡන්ද පත්‍රිකාවක් තැපෑලෙන් ගෙන්වා ගැනීම සඳහා ලිඛිත ඉල්ලීමක් කල හැක්කේ ජඡන්දදායකයාට පමණි.
- පූර්ව ඡන්ද අයදුම්පත් භාරදීම පුරව ඡන්ද සඳහා වන කාල සීමාවට මෙපිටින් සිදුකළ යුතුය
- ඔබගේ පූර්ව ඡන්ද භාවිතය සඳහා ඔබම ඉල්ලීම කිරීමට කාරුණික වන්න.
- පූර්ව ඡන්ද කාලසීමාව ආරම්භ වීමෙන් අනතුරුව ඡන්ද පත්‍රිකා තැපෑලට යොමුකරනු ලැබේ.
- අදාළ කාල සීමාව තුළ ඡන්දය භාවිත කිරීමට හැකිය.

මෙවැනි අවස්ථාවකදී මැතිවරණ කොමසාරිස්වරයා/වත්මනෙහි මැතිවරණ කොමිෂන් සභාව ගන්නා තීරණය අවසානාත්මක එකක් වන අතර එය ප්‍රශ්න කිරීමට අධිකරණයට හෝ අවසරයක් නැත. තවද ඉල්ලුම්පත්‍ර මාර්ගයෙන් ලබාගන්නා අදාළ නම් කාටත් බලාගත හැකි සේ පනතේ නම්කොට ඇති ස්ථානවල ප්‍රදර්ශනය කල යුතුය.

මෙකී වරප්‍රසාදය යම් යම් දේශපාලනිකව අස්ථාවර සමයන් හිදී පැවැත්වූ මැතිවරණ තුළ උපයෝගී කරගත් බව මැතිවරණ දෙපාර්තමේන්තුවේ මුලාශ්‍ර දක්වයි.

# අප්‍රාප්තික හෙවත් නිශ්චිත දිනයේ පැමිණිය නොහැකි ජන්ද හිමියන්

මෙම මැතිවරණ භාවිතය ලොව විවිධ රටවල භාවිතයට ගනු ලබන අතර එය ශ්‍රී ලංකාවේ ක්‍රියාවට නොනැඟුන තරමිය. යම් ආකාරයක අවස්ථාවක් ජන්දදායකයා වෙත ප්‍රදානය කරනු ලබන්නේ ඉහත සඳහන් කරන ලද ජන්ද පොළ වෙනස් කිරීම හා සබැඳි කරුණේ දී ය.

ඊට අදාළ මුලිකම කරුණක් වන්නේ මෙරටේ ජන්දය පැවැත්වෙන දිනට තම ජන්දය ප්‍රකාශ කිරීමට නොහැකිවන ජන්දදායකයන් කෙරෙහි වෙසෙස් අවධානයක් මැතිවරණ අනපනත් තුළ සටහන්ව නොතිබීමයි. එවැනි වෙනස්කමක් සඳහා මැතිවරණ දෙපාර්තමේන්තුව මෙන්ම මැතිවරණ කොමිෂන් සභාවද වරින්වර උත්සාහ ගෙන ඇති බව එහි බොහෝ වාර්තා තහවුරු කරයි. යටත් පිරිසෙන් අවස්ථා දෙකකදී පමණ එවැනි මැතිවරණ නීති ප්‍රතිශෝධනයක් සඳහා වන කමිටු පිහිටුවීමට මැතිවරණ දෙපාර්තමේන්තුව මෙන්ම කොමිෂන් සභාවද පියවර ගනු ලැබිය. එකී කමිටු විසින් සකස් කළ වාර්තාද රැසකි. ඒවායේ නියෝජිතත්වය දැරුවේද ඒ ඒ දේශපාලන පක්ෂ මඟින් මැතිවරණ දෙපාර්තමේන්තුගත/කොමිෂන් සභා කටයුතු සඳහා අනුයුක්ත කොට සිටි ප්‍රබල සාමාජිකයන්ය. එහෙත් අදාළ කාර්යයන්හි අවසන් ප්‍රතිඵලයක් කිසිදු විටෙක දක්නට නොලැබීම මෙරටේ මැතිවරණ නීති යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලිය තුළ පවත්නා මන්දෝත්සාහිත්වයට කදිම නිදසුනකි.

එහි වඩාත් සරදම් සහගත ප්‍රථිපලය වන්නේ මෙරටේ සියළු තීරණාත්මක මැතිවරණ අනපනත් නිකුත් කොට ඇත්තේ 80 දශකයේ මුල් භාගයේ හෝ ඊට පෙර වීමයි. මින් එකපැහැර අදහස් වන සරල කරුණක් වන්නේ එවක තිබූ සමාජාර්ථික හා දේශපාලන පසුබිම අදවනවිට සීඝ්‍ර වෙනසකට ලක්ව ඇති බවත් ඊට සමගාමීව මැතිවරණ නීතියේ වෙනස්කම් සිදුව ඇත්තේ ඉතා මන්දගාමීව බවත්ය. අනෙක් පසින් මෙරටේ දැනටමත් භාවිත සම්ප්‍රදායික ක්‍රමවේදවලින් ඔබ්බට ගමන් කිරීම සඳහා වන අභිලාශය ශ්‍රී ලාංකිකයන් තුළ ඇත්තේ අවම වශයෙනි.

# නීතිමය පසුබිම

මෙරටේ පවත්නා මැතිවරණ ක්‍රියාවලි ගණන 05 කි. ජනාධිපතිවරණය, පාර්ලිමේන්තු මැතිවරණය, පළාත් සභා ජන්ද විමසීම විමසීම්, පළාත් පාලන ආයතන ජන්ද විමසීම් හා ජනමත විචාරණය ආදී ලෙසිණි.
එහිලා අදාළ නීතිමය ප්‍රතිපාදන දක්වා ඇත්තේ ජනාධිපතිවරණය: 1981 අංක 15 දරන ජනාධිපතිවරණ පනත, පාර්ලිමේන්තු මැතිවරණය 1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත, පළාත් පාලන ආයතන ජන්ද විමසීම් ආඥා පනත (262 වන අධිකාරිය) , සහ ජනමත විචාරණය: 1981 අංක 7 දරණ ජනමත විචාරණ පනත ආදී වශයෙනි.
මේ හැම පනතේ ම සඳහන් වී ඇත්තේ සෘජුව ජන්ද විමසීම් දිනයේ දී ජන්ද මධ්‍යස්ථානයට ගොස් ජන්දය භාවිතා කිරීමේ ක්‍රමය පිළිබඳවය.
1981 අංක 01 පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 24 වන වගන්තියේ සඳහන්ව ඇත්තේ මැතිවරණ කොමසාරිස් නැතිනම් මැතිවරණ කොමිසම විසින් ජන්දය විමසීමේ දිනයක් නම් කිරීම සම්බන්ධවය. 26 වෙනි වගන්තියේ සඳහන්වෙව ඇත්තේ අදාළ මැතිවරණ දිනයේ දී යම්කිසි රාජකාරි කටයුතු වල නිරත වන කණ්ඩායම් ගැන,ඒ කණ්ඩායමට පමණක් ඊට කලින් ජන්දය පාවිච්චි කරන අයට තැපැල් ජන්ද අයැදුම් කොට තැපැල් ජන්දය භාවිත කළ හැක බවය.

එසේ තැපැල් ජන්දය භාවිත කළ හැකි වන්නේ ඉහත ද සඳහන් කොට ඇති පරිදි හමුදාව, පොලිසිය, මැතිවරණ රාජකාරියේ නිරත වන අය, ඊට අමතරව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකුව වැනි ආයතනවල නිලධාරීන්ට හා සේවකයින්ටය.

ශ්‍රී ලංකාවේ මිලියන හතරක් ජන්දය භාවිත නොකල පිරිසක් ඇත.ජන්දය භාවිතා කළ නොහැකි වන පිරිස් සඳහා තවත් විකල්ප ක්‍රමයක් ඇත. එනම් වෙනත් ස්ථානයක දී තමන්ගේ ජන්දය ප්‍රකාශ කිරීමට පහසුකම් සැලසීම.




නමුත් මෙම පහසුකම ද සලසා ඇත්තේ ඉතා සීමිත පිරිසකට පමණයි. එබැවි මිට ඉහත විස්තර කොට ඇත.


නීතී සම්මත කිරීමකින් තොරව දැනට පවත්නා විධිවිධාන ප්‍රකාරව කිසිසේත්ම පූර්ව ජන්ද භාවිතයක් යටතේ මැතිවරණ කොමිසමට මැතිවරණ පැවැත්වීමේ හැකියාවක් ද නැත

විකල්ප ජන්ද ක්‍රම භාවිත කිරීමේ අවශ්‍යතාව මෑත කාලීනව මෙරටේ ඇතිවූයේ මන්ද? අප විමසිය යුතු එක් ප්‍රමුඛ කරුණක් වන්නේ එයයි. ඊට අදාළ සාක්ෂි පහත මැතිවරණ ප්‍රතිඵල මඟින් සපයන්නේය. මෙහි උපුටා ඇත්තේ මෙරටේ අවසන් වරට පැවති ජාතික මට්ටමේ මැතිවරණ දෙක පමණි. එනමුත් සාපේක්ෂව අනෙක් මැතිවරණ ප්‍රතිඵල මතින්ද මෙහි අවධාරණය කිරීමට නියමිත කරුණ ම ඉස්මතු වන්නේය.

පාර්ලිමේන්තු මැතිවරණය - 2020 අගෝස්තු 05



ජනාධිපතිවරණය - 2019 නොවැම්බර් 17




ඉහත ජාතික මට්ටමේ මැතිවරණ දෙකෙහිදීම පොදුවේ දක්නට ඇති ලක්ෂණය වන්නේ සාතිශය බහුතර ඡන්ද ප්‍රමාණයක් අවසන් ගණන් කිරීමට එකතු නොවී ඇති බවයි. පොදුවේ පාර්ලිමේන්තු මැතිවරණය තුළ එලෙස භාවිත නොවූ ඡන්ද ප්‍රමාණය 3,920,516 ක් වන අතර ජනාධිපතිවරණයේදී එය 2,704,145 ක්ව ඇත. මේ අනුව මෙම මැතිවරණ දෙක සඳහාම යොදාගෙන ඇත්තේ වසර 2019 ඡන්දහිමි නාම ලේඛනයයි. සංසන්දනාත්මකව සළකා බැලීමේදී පාර්ලිමේන්තු මැතිවරණය තුළ ඡන්ද පොළට නොපැමිණ ඇති පිරිස සහ ජනාධිපතිවරණයේදී නොපැමිණි පිරිස එක්ව ගත් කල සමස්ත ලියාපදිංචි ඡන්දදායකයන්ගේ සංඛ්‍යාවෙන් හතරෙන් එකක් බව පෙනී යයි.

ලොව කවර හෝ රටක පවත්වන ඡන්දයකදී ඒසා විශාල ප්‍රමාණයක ඡන්ද සංඛ්‍යාවක් භාවිතයට නොගැනීම බරපතල අවධානයකට පාත්‍ර වියයුතු කරුණක් බව නොරහසකි.



ඒ අනුව එලෙස යම් ඡන්දදායකයෙක් ඡන්ද පොළ වෙත නොපැමිණීමට හේතුවන කරුණු කිහිපයක් දැක්විය හැකිය.

- විවිධ තාක්ෂණික හෝ පෞද්ගලික එසේත් නැත්නම් නොවැලැක්විය හැකි කරුණු හමුවේ වාර්ෂික ඡන්ද හිමි නාමලේඛනයේ තම නම ඇතුළත් කරගැනීමට නොහැකි වූ තැනැත්තන් (වසර 2022 සිට අළුත් ඡන්දදායකයන් ආකර්ෂණය කරගැනීමටත් - ඔවුන් ලියාපදිංචි කරගැනීමටත් අදාලව 18+ ලෙසින් ඡන්දදායකයන් ලියාපදිංචි කිරීමට අදාළ නීතිය සංශෝධනය කොට ඇත)

- ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වුවද පෞද්ගලික කාර්යයන්, හදිසි අසනීප හෝ විදෙස්ගතවීම් වැනි කාර්යයක නිරත වීමට සිදුවීම

- අදාළ නීති ප්‍රකාර ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචිව සිට ඡන්දපොළට ගියද එහිදී වලංගු අනන්‍යතා පත්‍රයක් නොතිබීම හෝ එලෙස පැවතියද එවැනි වලංගු ලේඛනවල නිල කාල සීමාව ඉකුත්ව ගොස් තිබීම. (නිදසුන්: ගමන් බලපත්‍රයේ කල් ඉකුත් වන දිනයෙන් පසුව ඡන්ද පොළට පැමිණීම) ආදී කරුණු

- මෙරටේ පැවැත්වෙන ඕනෑම මැතිවරණයකදී තම ඡන්දය භාවිත කිරීමට අපහසු හෝ අවම පහසුකම් සහිත පිරිස අතරින් වඩාත් බලපෑමට ලක්වන පිරිස

විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් -2,455,283
සමස්තයක් ලෙස වසර 2020 වනවිට මෙරටින් පිටව ගොස් විදෙස් රැකියාවන්හි නිරත ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව මෙහි දක්වේ. තවත් යම් සැළකිය යුතු මට්ටමේ විශාල පිරිසක් යුද්ධය පැවැති සමයේ හා වෙනත් නීති විරෝධී මාර්ගවලින් විදෙස්ගතව ඇත. ඔවුන් පිළිබඳ නිශ්චිත දත්ත හමුනොවේ. මෙහි සඳහන් වන්නේ යම් විදෙස් රැකියාවක් සඳහා පිටව යාමේදී විදේශ රැකියා නියුක්ති කාර්යාංශය නිසි පරිපාටිගතව යාවත්කාලීන කරන ලද තැනැත්තන්ගේ සංඛ්‍යා දත්ත පමණි. මෙම තොරතුරු ලබාගෙන ඇත්තේ මුළුමනින්ම විදෙස් සේවා නියුක්ති කාර්යාංශය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු දැනගැනීමේ අයදුම්පත් මඟිනි)

මෙරටට සර්වජන ජන්ද බලය ලැබී බොහෝ කලක් ගත වුවද, මෙතෙක් මේසා විශාල පිරිසක් මැතිවරණ සිතියම ඇස ගැටෙන මානයෙන් ඉවත්කොට තිබීම සුපසන් ප්‍රජාතන්ත්‍රවාදයක් අපේක්ෂා කරන සමාජයක පවත්නා බලවත් ගැටලුවකි. එහෙත් ඊට පිළියම් යෙදීමද පහසු නැත. සෑම ජන්දයකදිම මෙම පිරිස අතහැරුණද, ඔවුන්ගේ වැටුප් ඇසුරෙන් ලබන ප්‍රේෂණ ශ්‍රී ලංකාවේ ආර්ථිකය ශක්තිමත් කරයි. ආර්ථික අර්බුදයක් හමුවේ ශ්‍රී ලංකාව ඉමහත් ව්‍යසනයකට ලක්ව සිටින මෙසමයේ එය වෙසෙසින්ම ආවධානයට ලක්වන්නකි. එහෙත් යථාර්තය වන්නේ මෙකී පිරිසේ ජන්ද අයිතිය ආරක්ෂා කිරීම සඳහා දරා ඇති තැත එතරම් ප්‍රශස්ථ නොවන බවයි.

මේවන විටත් මීට අදාළ කරුණු විමසීම සඳහා පාර්ලිමේන්තු බලතල ප්‍රකාරව මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත්කොට ඇත. ඊට අමතර වශයෙන් මීට පෙරද යහපාලන ආණ්ඩු සමයේ (වසර 2015 - 2019) එවැනිම කාරක සභාවක් පත්කරනු ලැබීය. එහෙත් එය රැස්වී තිබුණේ ඒකම එක අවස්ථාවකදී පමණි.

අයියේ මේ කොටස එකතු කරන්න විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්ගේ ජන්ද අයිතිය කොටසට

එක් පසෙකින් විශාල ප්‍රමාණයක සිසුන් පිරිසක් ශ්‍රී ලංකාවෙන් පිටත අධ්‍යාපනය සඳහා යොමුවීම ආර්ථික වශයෙන් ශ්‍රී ලංකාව තමන් සතු විදේශ විනිමය වක්‍රාකාර ලෙස නැවත විදෙස් රටවල් සඳහා යොමුකිරීමක් වන්නේය. ඒ කෙසේ වෙතත් මෙරටේ සිට විදෙස්ගතව සිටින ශ්‍රී ලාංකිකයන්ගේ ජන්ද අයිතිය තහවුරු කිරීම උදෙසා මෙතෙක් වඩාත් පුළුල් උත්සහයක් ගෙන නැති බව පැහැදිලි කරුණකි.

මෙරටින් දිනකට විදෙස්ගතවන සමස්ත මගීන් සංඛ්‍යාව දළ වශයෙන් 11,000 ක් පමණ වේ. ඊට  සංචාරකයන්, ද්විත්ව පුරවැසියන් , ශිෂ්‍යයන් සහ රාජ්‍යතාන්ත්‍රික හෝ හමුදාමය ආදී කැඳවීම් ලැබ මෙරටින් නික්මෙන පිරිස අයත්ය. ඒ ඒ අනුව ස්ථිරවම දිගු කලක් රැකියා  සඳහා නික්මෙන පිරිස කොපමණදැයි යන්න නිශ්චිතව සොයාගැනීමේ ක්‍රමවේදයක් නොමැත. එපමණක් නොව විදෙස් සේවා නියුක්ති කාර්යංශය සතුව පවත්නා තොරට්ගු-තොරතුරුද නිසිලෙස යාවත්කාලීන  වූ තොරතුරු නොවේ. එක් පසෙකින් එහි කිසිදු ලියාපදිංචි වීමකින් තොරව විදෙස් රැකියා සඳහා නික්මෙන පිරිස අධිකය. අනෙක් පසින් දැනටමත් ජනගත කොට ඇති සංඛ්‍යා සහ දත්ත අතර පවතින්නේ බරපතල විෂමතාවකි. නිදසුනක් ලෙස වසර 2010 සිට ම ඉතාලිය තුළ සිටින විදෙස් සේවා නියුක්ති කාර්යංශයෙහි ලියාපදිංචි ශ්‍රමිකයන් ගණන 410 ය යන සංඛ්‍යාව පිළිබඳව සළකා බැලීම වැදගත්ය.

මෙම සංඛ්‍යා දත්ත පිළිබඳව විදෙස් ගත වුවන්ගේ ජාත්‍යන්තර සංසදයෙන් විමසීමේදී තහවුරු වූයේ ඉතාලියේ මිලානෝ නගරයේ පිහිටි එක් කුඩා නගරයක පමණක් ශ්‍රමිකයන් සේ කටයුතු කරන ශ්‍රී ලාංකිකයන් ප්‍රමාණය අදාළ ගණනට වඩා වැඩි පිරිසක් බවයි. මීට හේතුවියහැකි කරුණු අතර කිහිපයක් පමණක් මෙහිලා සඳහන් කල හැකිය. එක් කරුණක් කරුණක් වන්නේ ශ්‍රී ලාංකීය ශ්‍රම බලකායට අදාළව එක් කේන්ද්‍රීය දත්ත පද්ධතියක් කිසිදු තැනක

යාවත්කාලීන නොවීමයි. එක් පසෙකින් මැතිවරණ කොමිෂන් සභාව, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සහ ආගමන විගමණ දෙපාර්තමේන්තුව ඒකාබද්ධව පුරවැසියන්ගේ අනන්‍යතාව පහසුවෙන් හඳුනාගත හැකි ඩිජිටල්ගත හඳුනාගැනීමේ කාර්ඩ්පතක් වැනි එකක් හඳුන්වා දීම මෙරටේ දිගුකලක් තිස්සේ අතපසු වෙමින් තිබෙන මන්දගාමී ව්‍යාපෘතියකි. අනෙක් පසින් විදේශ අමාත්‍යංශය සහ ඒ යටතේ පවත්නා විදේශ සේවා නියුක්ති කාර්යංශය වැනි ඒවා ලොව පුරා පිහිටි ශ්‍රී ලංකාව නියෝජනය කරන විදෙස් දූත මණ්ඩල කාර්යාල හා එක්ව මධ්‍යගත දත්ත පද්ධතියක් නිර්මාණය කල යුතුය.

එවැනි සුහුරු මාදිලියේ පරිගණක යෙදවුමක් නොමැති නිසා සිදුවන එක් අවාසිදායක තත්වයක් මෙහිලා පැහැදිළි කිරීමට හැකිය. එනම් යම් ශ්‍රමිකයෙක් මැදපෙරදිග රැකියාවක් සඳහා පිටත්ව ගොස් ටික කලක් ගිය පසු ඉතාලිය වැනි රටකට තවත් රැකියාවක් සඳහා නික්ම යන්නේනම් එකී තැනැත්තා පිළිබඳ තොරතුරු කිසිදු තැනක යාවත්කාලීන නොවීමයි. එවැන්නක් ක්‍රමවත්ව සිදුකිරීම සඳහා පොදුවේ ලොව කොතැනක හෝ පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාල පරිශ්‍ර තුළ ස්ථාපනය කොට ඇති පරිගණක පද්ධතියක් සඳහා නම් කරන නිළධාරීන් හට ප්‍රවේශය ලබාදිය හැකිය.

මෙලෙස කතාබහට ලක්කරන පිරිස කිසිසේත්ම මෙරටේ ජන්ද අයිතිය අහිමි පිරිසක් නොවේ. විදෙස්ගත ජනතාව වෙත තම ඡුන්දය භාවිත කිරීමේ පහසුකම් සළසාදීමේ දී ජාත්‍යන්තර මට්ටමෙන් අනුගමනය කරනු ලබන ක්‍රමවේද කිහිපයක් පහත දක්වා ඇත.

ආපසු පැමිණ ඡුන්දය භාවිත කිරීම : මෙය සෘජු ලෙස විදෙස්ගත ජන්ද භාවිතයට අදාළ වන්නක් නොවේ. එහෙත් මෙහිදී ප්‍රධාන ගුවන් තොටුපොළ හෝ වෙනත් ගොඩබසින ස්ථානයක් කේන්ද්‍රකරගනිමින් ජන්ද පොළක් පිහිටුවා තමන් රාජකාරි කරන රටෙහි ලියාපදිංචි වූ පුරවැසියන් හට යළිත් මව් රටට පැමිණ ජන්දය භාවිතකොට යළිත් ආපසු යාමට පහසුකම් සැළසීමයි. එකී ක්‍රමවේදය භාවිත කළ හැක්කේ ධනවත් රටවල ජන්දදායකයින් හට පමණක් බව පැහැදිලි කරුණකි.

අදාළ විදෙස්ගත රටවල්වල තානාපති හෝ කොන්සියුලර් කාර්යාලවලට පරිබාහිරව පිහිටුවන ජන්ද මධ්‍යස්ථාන වෙත ගොස් ජන්දය භාවිත කිරීමට මෙහිදී පහසුකම් සළසා දෙයි. එහෙත් ඒ සඳහා වැය වන මුදල අතිවිශාල එකක් වන අතර වෙනත් රටක ජන්දයක් සඳහා තම රටෙහි භූමිය එලෙස භාවිත කිරීම සඳහා ඉඩකඩ ලබා දීමට සමහර රටවල් එකඟවේද යන්න ද සැක සහිතය.

එක් එක් රටවල පිහිටුවා ඇති තානාපති හෝ කොන්සියුලර් කාර්යාල ආශ්‍රිතව ඡුන්ද මධ්‍යස්ථාන පිහිටුවීමයි. මෙය ඉතා බහුලව භාවිත කරනු ලබන, ඉතා සුරක්ෂිත ක්‍රමවේදයක් වුවද ගැටළුව වන්නේ යම් රටක අදාළ කාර්යාල වලට ඉතා බැහැරින් රාජකාරි කරන ජන්දදායකයෙකු එදිනට නිවාඩු රැගෙන දුරු කතර ගෙවාගෙන පැමිණේ ද යන්නයි. නිදසුනක් ලෙස සෞදි අරාබිය වැනි රටක, ඉතා දුර බැහැර නිවසක ගෘහ සේවයේ යෙදෙන කාන්තාවක් තම ජන්ද භාවිතය සඳහා පැමිණෙන්නේ නම් අවදානයට ලක් කළ යුතු පූර්ව කොන්දේසි කිහිපයකි. තම ස්වාමියාගෙන් ඒ සඳහා අවසර ලබා ගැනීම, ඊට අදාළ ගමනාගමන පහසුකම් සළසා ගැනීම, අදාළ මූලික ලියාපදිංචි වීම් ආදී කටයුතු සපුරා තිබීම ඉන් කිහිපයකි.

තම මව් රටේ ඡුන්දයට ලියාපදිංචිව, වෙනත් රටක දිවි ගෙවන ඡුන්දදායකයන් හට තැපැල් මගින් ජන්ද පත්‍රිකාව ලැබීම හා පෙරළා ගෙන්වා ගැනීම මෙහිදී සිදු කෙරේ. මෙය බොහෝ රටවල අනුගමනය කරනු ලබන ඉතා සුරක්ෂිත හා පහසු ක්‍රමවේදයකි . එහෙත් පසුගිය මහා මැතිවරණයේ දී පක්ෂපාතීව කටයුතු කිරීම නිසා මෙරටේ තැපැල් අමාත්‍යංශ ලේකම්වරයා අදාළ අමාත්‍යංශයෙන් මාරු කර යැවීමට එවකට මැතිවරණ කොමසාරිස්වරයා ක්‍රියා කරන ලද බව ප්‍රකට සිද්ධියකි. එවන් වාතාවරණයක, තැපැල් ජන්දයේ පවත්නා විශ්වාසනීයත්වය ද ප්‍රශ්ණකාරී බව නොකිවමනාය.

අන්තර්ජාලය හරහා තම ජන්දය භාවිත කිරීම මින් සිදු වේ. ලොව දියුණු වී ඇති සන්නිවේදන තාක්ෂණය ගැන සළකා බැලීමේ දී එවැන්නක් සුරක්ෂිත යැයි හැඟුණ ද මෑත කාලීනව ඇමරිකාව වැනි රටවල සිදු වූ සිදුවීම් සළකා බැලීමේ දී පැහැදිලි වන්නේ එය ද අයථා පරිහරණයට තවමත් විවෘත ක්‍රමවේදයක් බවයි.

ඉහත ක්‍රමවලට අමතරව ඔස්ට්‍රේලියාව සහ නවසීලන්තය වැනි රටවල් දැනට භාවිත කරන පරිදි ෆැක්ස් මගින් ඡුන්දය භාවිත කිරීම ද සිදු කිරීමේ හැකියාව පවතී.

තමන් වෙනුවට වෙනත් නම් කරනු ලබන අනුප්‍රාප්තිකයෙකු මගින් ජන්දය භාවිත කිරීම මෙනමින් හැඳින්වේ. මෙම ක්‍රමවේදය කෙරෙහි රටවල් එතරම් විශ්වාසයක් තබා නොමැති අතර ශ්‍රී ලංකාව වැනි රටකටද එවැන්නක් යෝග්‍යය වේ යැයි සිතීම දුෂ්කරය.

ආබාධ සහිත ජන්දදායකයන්- 1,620,000
(මෙහි සඳහන් වන්නේ මෙරටේ දැනට දිවිගෙවන සමස්ත ආබාධ සහිත පුද්ගලයන්ගේ සංඛ්‍යා දත්තයි. එහෙත් ඊට අදාළව පවත්නා සුවිශේෂී තත්වය නම් මෙරටේ දැනට භාවිතයට ගැණෙන දත්ත ලබාගෙන ඇත්තේ වසර 2012 දිපව්‍යප්තව පැවති සංගණනය මගින් වීමයි. ඒ අනුව ගෙවී ගිය දශකයක කාල සීමාව තුළ නිසැකවම මෙම පුද්ගල සංඛ්‍යාව වර්ධනය වී ඇත. තවද මෙහිලා උපයෝගී කරගෙන ඇති දත්ත අනුව ඉහත සඳහන් මිලියන 1.6 යනු වයස අවුරුදු 05 හෝ ඊට වැඩි වයස් ප්‍රමාණයේ තැනැත්තන්ය. එහිලා වයස 18 ට වැඩි තැනැත්තන්ගේ සංඛ්‍යා දත්ත පමණක් මීට අදාළය. වසර 2012 න් පසුව මෙරටේ ප්‍රමාණවත් දීපව්‍යාප්ත සංගණනයක් සිදුව නොපැවතීම මෙම ගැටළුකාරී සංඛ්‍යා දත්ත තෝරාබේරා ගැනීමේදී බලවත් ගැටළු ඉස්මතු කරයි. මෙම තොරතුරු සඳහා මූලික වශයෙන් පාදක වන්නේ වසර 2012 සිදුකල ජාතික සංගණනයයි. ඊට අමතර වශයෙන් මැතිවරණ කොමිෂන් සභාව සහ ආබාධ සහිත පුද්ගලයන්ගේ ජන්ද අයිතිය පිළිබඳව ක්‍රියා කරන සංවිධාන සහ එහි නිමග්න ක්‍රියාකාරිකයන්ගේ අදහස් ලබාගෙන ඇත)

මැතිවරණ දිනයේ අත්‍යවශ්‍ය සේවාවන්හි නිරත රජයේ සේවකයන් (තැපැල් ජන්ද හිමිකම පිරිනමා නැති 5,000 කට වැඩි පිරිසක් බලපෑමට ලක්වේ. මෙහිදී අදහස් කරනු ලබන්නේ රජයේ සේවකයන් වුවද දැනටමත් තැපැල් ජන්ද හිමිකම නොලද පිරිසයි. මෙරටේ අවසන් වරට පැවති පාර්ලිමේන්තු මැතිවරණයේදී එලෙස තැපැල් ජන්ද භාවිතය සඳහා අයදුම්පත් 6,594 ක් ලැබී තිබූ අතර ඉන් 705, 505 ක පමණ ප්‍රමාණයක් අනුමත කොට තිබුණි. මීට අදාළ වන ක්ෂේත්‍ර මෙම අදහස විස්තර කිරීමේදී අන්තර්ගත කොට ඇත. සමස්තයක් ලෙස පසුගිය පාර්ලිමේන්තු මැතිවරණ කාල සීමාව තුළ මැතිවරණ කොමිෂන් සභාව තම කොමිෂන් සභාවෙන් පරිබාහිරව සේවය ලබාගත් මුළු රජයේ සේවක සංඛ්‍යාව 164,805 ක් පමණ වේ.ඊට අමතරව කොවිඩ් 19 කාල සීමාවක් වූ බැවින් සෞඛ්‍ය කාර්ය මණ්ඩලද තීරණාත්මක මෙහෙයක් සිදුකොට ඇත. එලෙස මැතිවරණය සඳහා සහය වූ සමස්ත සෞඛ්‍ය කාර්ය මණ්ඩල සංඛ්‍යාව 14,372 ක් පමණ වේ.) ඒ අනුව මෙම සටහනෙහි සඳහන් වන්නේ එලෙස වාර්තාගත වූ පිරිස් නොව පොදුවේ රටෙහි අත්‍යවශ්‍ය සේවාවන් සඳහා තම සේවය ලබාදුන් තැනැත්තන්ය. ඉහත සඳහන් කල පිරිස සතුව තැපැල් ජන්ද පහසුකම බොහෝවිට පවතින අතර එසේ නොමැතිනම් සාමාන්‍ය ක්‍රමවේදය පරිදි තම ජන්දය භාවිත කොට ඇත. සෞඛ්‍ය සේවකයන් හා සබැඳි කරුණු මෙහි වෙනත් තැනෙක විස්තර කෙරේ. මීට අදාළ මූලික තොරතුරු ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව 2022 අගෝස්තු 05 වැනි දින පැවැත්වූ පාර්ලිමේන්තු මැතිවරණය සම්බන්ධයෙන් නිකුත් කරන ලද වාර්තාව මත පදනම්ව ඇත. ඊට අමතර වශයෙන් අදාළ එක් එක් ආයතනය ආශ්‍රයෙන් ලබාගත් තොරතුරු අන්තර්ගතගතය. ජන්ද විමසීමක් පැවැත්වෙන දිනයේදී තැපැල් ජන්ද පහසුකම් නොලබන එහෙත් අත්‍යවශ්‍ය රාජකාරිවල නිරතවන රජයේ සේවකයන්සෞ

ලෙස හඳුනාගත හැකි වන්නේ සෞඛ්‍ය කාර්ය මණ්ඩල, වරාය, අධිවේගී මාර්ග, ගුවන් තොටුපොළ, ජල සම්පාදන, රජයේ මාධ්‍ය ආයතන,විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා රේගුව ආදී ස්ථානබදව සේවා සපයන පිරිස්ය).

මැතිවරණ දිනය වන විට රක්ෂිත බන්ධනාගාරගත කොට සිටිය හැකි රැඳවියන් - මෙරටේ අවසන් වරට වසර 2020 පැවති පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වෙන අවස්ථාව වනවිට රැඳී සිටි සමස්ත සිරකරුවන් සංඛ්‍යාව 27542 ක් පමණ විය. ඉන් රැඳවියන් 11,000 ක් පමණ රක්ෂිත බන්ධනාගාරගත වුවන් ලෙස සැළකේ.සමස්ත ජනගහනයෙන් 100,000 ක ප්‍රමාණයක් සඳහා සිරගතව ඇති සංඛ්‍යාව 114 ක් සේ නිරීක්ෂණය වන අතර අදාළ තොරතුරු ලබාගැනීමේදී රැඳවියන් රැඳී සිටි ස්ථාන ලෙස සටහන්ව ඇත්තේ බන්ධනාගාර දෙපාර්තමේන්තුව සතුව පවත්නා බන්ධනාගාර මුලස්ථානය, පර්යේෂණ විශෝධන පුහුණු මධ්‍යස්ථානය,ආරක්ෂිත බන්ධනාගාර -04, රිමාන්ඩ් බන්ධනාගාර -18, වැඩ කඳවුරු 10, විවෘත බන්ධනාගාර කඳවුරු -02, බන්ධනා ගාර පුහුණු පාසැල් -01, සහ තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථාන -02 ආදී වශයෙනි. මෙම තොරතුරු ලබාගෙන ඇත්තේ බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත යොමුකරන ලද තොරතුරු ඉල්ලා සිටීමේ අයදුම්පත් මඟිනි)

මැතිවරණ දිනයේ රෝහල්ගතව නේවාසික ප්‍රතිකාර ලැබිය හැකි රෝගීන් - 12,000. ශ්‍රී ලංකාවේ රජයේ රෝහල් සතු සමස්ත ඇඳන් සංඛ්‍යාව 103,337 ක් වන අතර රෝහල් සංඛ්‍යාව 1090 ක් පමණ වේ. සාමාන්‍ය වශයෙන් කොළඹ ජාතික රෝහලෙහි පමණක් 13,000 කට අධික රෝගීන් ප්‍රමාණයක් නිතිපතා ප්‍රතිකාර ලබාග න්නා අතර ඉහත සංඛ්‍යාව 12,000 ක් පමණ වීමට බලපාන කරුණ වියහැක්කේ මැතිවරණය ආසන්නයේ යම් මඳ හෝ සුවයක් මෙන්ම ඡන්දය ප්‍රකාශ කිරීමේ අභිලාෂයෙන් යුත් රෝගීන් නිවෙස් බලා යෑමේ උනන්දුවකින් පසුවීම විය හැකිය. සමස්ත කාර්ය මණ්ඩලය ද - 134,600ක් පමණය. ඒ අනුව එකී සමස්ත ප්‍රමාණයෙන් මෙතෙක් තැපැල් ඡන්ද වරම ලබාගත් පිරිස 14,372 ක් පමණක්ය. ඒ පසුගිය කාල සීමාව තුළ මෙරටේ පැවති කොවිඩ් ව්‍යසනය තුළ සෞඛ්‍ය සේවකයන්ගේ උපරිම සහය ලබාගැනීමේ අරමුණිනි. නමුත් වඩාත් සැළකිය යුතුම කරුණක් වන්නේ මෙම ප්‍රමාණය තුළ පෞද්ගලික රෝහල් තුළ දිනක් තුළ කෙතරම් ප්‍රමාණයක පිරිසක් නේවාසිකව ප්‍රතිකාර ගන්නේද යන්න පිළිබද නිශ්චිත අදහසක් නොමැති බවයි. අදාළ පාර්ශව විමසීමේදී තහවුරු වූයේ එකී පිරිස 8,000 කට මඳක් වැඩි බවය. එහෙත් ඊට අදාළ දත්ත සඳහා වන අයදුම්පත් මෙන්ම ලිපි වෙතද මෙතෙක් ප්‍රතිචාර ලැබී නැත).

මැතිවරණ පැවැත්වෙන කාල වකවානු තුළ ගැඹුරු මුහුදේ ධීවර කටයුතුවල නිරතවන ධීවරයන් - 30,000 කට වැඩි පිරිසක්. සමස්තයක් ලෙස මෙරටේ ධීවර කර්මාන්තයෙහි නිරත ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචි ධීවරයන් සංඛ්‍යාව පිරිස 43157 කි. එහෙත් ඉන් පරිබාහිරව සැළකිය යුතු පිරිසක් සිටින බව ඉලක්කගත කණ්ඩායම් සාකච්ජාවේදී සහ ඉන් අනතුරුව පැවති සාකච්ජා වලදී තහවුරු විය. පොදුවේ දැනට වසර 2022 වනවිට ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කොට ඇති ධීවර යාත්‍රා ගණන 32178 කි. මෙම ප්‍රමාණය සමන්විත වන්නේ දින 5 ට අඩු වෙරළාසන්න යාත්‍රා, ගමන් ගන්නා ගැනියන්, බහුදින ධීවර යාත්‍රා සහ ගමන් ගන්නා ගැනියන් (1 day) ආදී ලෙසිණි. යටත් පිරිසෙන් එක් බහුදින යාත්‍රාවක් සතියක කාලයේ සිට මාස තුනක පමණ පරාසයක විහිදෙන සේ මුහුදේ තම ධීවර කටයුතු වල නිරත වේ. එවැනි එක් යාත්‍රාවක පුද්ගලයන් 05- 06 දෙනෙක් පමණ ගමන් ගනී. මේ අනුව ඉහත සඳහන් කරන ලද පිරිසේ නිශ්චිත තොරතුරක් ලබාගැනීම මඳක් අපහසු වන අතර සමහරවිටෙක ඉහත සංඛ්‍යාව වෙනස් වීමේ සම්භාවිතාව බොහෝ වැඩිය.

මැතිවරණ දිනයේ රාජකාරීන්හි නිරත මාධ්‍යවේදීන් සහ අනෙක් කාර්ය මණ්ඩල සේවකයන්- 10,000 කට වැඩි පිරිසක්. මෙහිදී සළකා බලා ඇත්තේ මැතිවරණ වාර්තාකරණයෙහි සහ ඊට සමාන්තර වැඩසටහන් නිෂ්පාදනයෙහි නිරත පිරිස පමණක් නොවේ. යම් මැතිවරණයක් පැවැත්වෙන කාල සීමාව තුළ රටෙහි මාධ්‍යකරණයෙහි නිරත ආයතන පද්ධතිය තුළ සේවය කරන සමස්ත පිරිසෙන් යම් තෝරාගත් සේවක පිරිසක්ය. ජනමාධ්‍ය සහ ප්‍රවෘර්ති අමාත්‍යංශයට අනුව එහි ලියාපදිංචි ප්‍රාදේශීය මාධ්‍යකරුවන් සංඛ්‍යාව 2900 ක් වන අතර ඔවුන් තම කාර්යය සිදුකරනු ලබන්නේ දිවයිනේ සිව්දෙස විසිර පැතිරගිය පිරිසක් ලෙසය. ඊට අමතර වශයෙන් විද්‍යුත් මාධ්‍ය ආයතන සංඛ්‍යාව 70 ක්ද, මුද්‍රිත මාධ්‍ය ආයතන සංඛ්‍යාව 89 ක් ද ස්ථාපිත පවතී. තවද වෙබ් මාධ්‍ය ආයතන 31 ක් සහ පුහුණු සහ වෙනත් ආයතන 103 ක් මෙරටේ පවතී. මෙම කරුණට අදාළව රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශහිම මධ්‍යකරණයෙහි මෙන්ම ඊට අයත් තාක්ෂණික, නිෂ්පාදන සහ අලෙවිකරණ යන සෑම අංශයකම සේවයෙහි නිරත පිරිස් පිළිබඳ වඩාත් පුළුල් සමීක්ෂණයක් සිදුකල යුතුව පවතී. එක් මූලික පියවරක් ලෙස මෙමඟින් හඳුනා ගත හැක්කේ ඉතා සැළකිය යුතු ප්‍රමාණයක පිරිසක් තම රාජකාරි ස්ථානීමය වෙනස තුළ ජන්ද භාවිතයට වරම් නොලබන බවයි.

මැතිවරණ සංවිධාන ආශ්‍රිතව ස්වේච්ජා සේවයක නිරත මැතිවරණ නිරීක්ෂකයන්: යටත් පිරිසෙන් 1,000 කට වැඩි පිරිසක් මෙලෙස තම ජන්දය භාවිත කිරීමේ වරප්‍රසාදයෙන් ඉවත්ව සිටින බව නිරීක්ෂණයයි. එහිලා වඩාත් වැදගත් වන්නේ යම් සුහුරු භාවිතයක් සඳහා අවස්ථාවක් උදාවේනම් ඊට අනුගත වියහැකි මැතිවරණ නිරීක්ෂකයන් ප්‍රමාණය ඉමහත් බවයි. පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයට සමගාමීව පැෆ්රල්, මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය, කැෆෙ යන සංවිධාන මඟින් සේවයෙහි නිරත කරන ලද සමස්ත නිරීක්ෂකයන්ගේ සංඛ්‍යාව 15,000 කට ආසන්නය. ඔවුන් අතර ස්ථානීය හෙවත් දින නිරීක්ෂකයන්, දිගුකලක් කටයුතු කරන එනම් මැතිවරණ ප්‍රචාරක කාල සමය තුළ ක්‍රියාකරන දිගු කාලීන නිරීක්ෂකයන්, මෙන්ම ජංගම නිරීක්ෂකයන් ද අන්තරගතය. මින් ජංගම නිරීක්ෂකයන් බොහෝ විට ආකාර දෙකකින් තම නිරීක්ෂණ කාර්යය සඳහා එක්වේ. සමහරදෙනෙක් තමන්දිවිගෙවන ප්‍රදේශහිම සිට ඊට එක්වන අතර තවත් සමහරෙක් කොළඹ ප්‍රධාන කාර්යාලයට පැමිණ තමන් අනුයුක්ත කරන ලද පෙදෙස් කරා ආයතනය ලබාදෙන ජංගම රථයෙන් ගමන් කරයි. පැෆ්රල් සංවිධානය මෙම ක්‍රම දෙකම උපයෝගී කරගන්නා අතර මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මද්‍යස්ථානය බොහෝ විට දිවයිනේ සිව් දිග විසිර සිටින පුද්ගලයන් කොළඹට කැඳවා නිසි පුහුණුවකින් අනතුරුව අදාළ ප්‍රදේශ කරා යොමුකරයි.

තවද මෙකී පිරිස් ජන්ද ගණන් කිරීමේ කාර්යය සඳහා ද නිරීක්ෂණයෙන් එක්වීම වසර 2015 සිටම සිදුවන්නකි. මේ අනුව වඩාත් පැහැදිළි කරුණ වන්නේ කවර හෝ විකල්ප අවස්ථාවක් පවතීනම් ජන්ද භාවිතයේදී මෙම පිරිස සාමාන්‍ය ක්‍රමවේදයෙන් බැහැරව තම පරමාධිපත්‍යය බලය අභ්‍යාස කිරීමේ රුචිකත්වයෙන් පසුවන බවයි.

බියගම සහ කටුනායක ඇතුළු ආයෝජන කලාප 13 ක සේවයේ නිරත සේවක පිරිස් 20,000 කට වැඩි පිරිසක්. මෙරටේ පිහිටුවා ඇති සමස්ත ආයෝජන කලාප සංඛ්‍යාව 13 කි. ඉන් ප්‍රධානතම හෙවත් වැඩි සේවක පිරිසක් සේවයෙහි නිරතව සිටින්නේ බියගම - කටුනායක ආයෝජන කලාපගතවය. සංඛ්‍යාත්මකව එය 80,000 කි. වෙනත් ආයෝජන කලාප හා සැසඳීමේදී මෙහි විශේෂත්වය නම් මෙම ජනපදය වෙත රැකියා සඳහා පැමිණ ඇති බොහොමයක් පිරිස් ගම්පහ දිස්ත්‍රික්කයෙන් ඔබ්බේ දිවයිනෙහි සියළුම පරිපාලන දිස්ත්‍රික්ක නියෝජනය කරන සේවක පිරිස් වීමයි. එහිලා පැන නැඟී ඇති බලවත්ම ගැටළුව නම් මැතිවරණ කොමිෂන් සභාව සහ කම්කරු දෙපාර්තමේන්තුව ඒකාබද්ධව සකසා ඇති පෞද්ගලික අංශයේ සේවකයන් හට මැතිවරණය පවතින නිවාඩු ලබාදීමේ

නිවේදනය ප්‍රකාරව නිසි පරිදි අදාළ ආයතන මඟින් නිවාඩු ලබානොදීම සහ යම්හෙයකින් නිවාඩු ලබාගත්තේ වුවද, තම ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ගම්බිම් බලා යෑම දරන්නට සිදුවන අධික පිරිවැය හමුවේ සැබෑ අභියෝගයක් වී ඇති බවයි.

තවද එහිලා ඡන්ද භාවිතය කෙතරම් වැදගත් වුවද ඒ පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයකින් පසුවුවද, මෙහි සේවයෙහි නිරත බොහෝ දෙනෙකුගේ ආර්ථික පසුබිම හමුවේ එලෙස ඡන්ද ප්‍රකාශ කිරීම සඳහා තමන් හට නියමිත ඡන්ද පොළ කරා දුරැකතර ගෙවමින් යෑම තවදුරටත් කල හැකි යමක් සේ පෙනී නොයයි. විශේෂයෙන්ම අඛණ්ඩව දින 24 ක් පමණ සේවයෙහි නිරත වූ විටත්, යම් නිවාඩු දිනෙක සේවය සළසන විටත් අදාළ සේවක සේවිකාවන් හට අමතර පාරිතෝෂික දීමනාවක් ලැබෙන අතර ඡන්ද ප්‍රකාශ කිරීමට නික්මුණහොත් එය අහිමිවීමේ ඉඩක් පවතී. එබැවින් බොහෝ විට අදාළ ඡන්දදායකයන් ඡන්ද භාවිතයෙන් ඈත්ව සිටීම අරුමැසි යමක් නොවේ.

ඊටත් අමතර වශයෙන් මින් සැළකිය යුතු ප්‍රමාණයක පිරිසක් ගම්පහ පෙදෙස්බවද රැඳී සිටීමේදී තම සහකරුවන් හෝ සහකාරියන් සමඟ සමඟ දිවිගේවීමද සුලභ අත්දැකීමකි. එවන් විටෙක තම ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා තමන් ලියාපදිංචිව සිටින පෙදෙස් කරා යෑමට සිදුවන්නේ දෙදෙනාට එකට එක්ව නොව වෙන වෙනමය. එවන් විටෙකද වෙන්වෙන්ව ගමන් කිරීමටද අදාළ පිරිස් මැලිවන ස්වභාවයක් අදාළ සමීක්ෂණයේදී නිරීක්ෂණය විය. එබැවින් මෙකී ගැටලුව විසඳිය යුත්තේ සාකල්‍යමය (ඍදකසිඑසපි) ප්‍රවෙශයකිනි. ඊට හේතුව නම් මිට අදාළව ගන්නා තීරණ විවිධ පාර්ශව වෙත නොයෙක් ආකාරයෙන් බලපෑම් කළ හැකි බැවිනි.

අනෙක් වැදගත්ම කරුණ නම් පාලනාධිකාරියයි. පොදුවේ ආයෝජන මණ්ඩලය සතුව ඡන්ද ප්‍රකාශ කිරීම ප්‍රමුඛව සේවක අයිතිවාසිකම් පිළිබඳ සුබවාදී දැක්මක් පැවතීම මෙහිදී තීරණාත්මක සාධකයකි. මෙතෙක් එවැනි ධනාත්මක ස්ථාවරයක් ඔවුන්ගෙන් පිළිබිඹුව ඇත්දැයි යන්න ප්‍රශ්නාර්ථයකි. අනෙක් පසින් අදාළ පාලනාධිකාරීන් වුවද මෙවැනි අයිතීන් පාදක ප්‍රවේශයක් වෙත දක්වන නැඹුරුතාව එතරම් හිතකර එකක් නොවේ. එහෙත් සේවක අයිතීන් කෙරෙහි



ආශක්ත වෘත්තීය සමිති සහ වෙනත් සිවිල් සමාජ සංවිධාන කිහිපයක් මෙම ගැටළුව කෙරෙහි සාධනීය මැදිහත්වීමක් දක්වමින් සිටී. මෙම තොරතුරු ලබාගැනීමේදී අදාළ පාර්ශව සමඟ පුළුල් සාකච්ජාවක් පැවැත්වූ අතර කළමනාකාරිත්වයෙන් තොරතුරු ඉල්ලා යැවූ කිසිදු ලිපියක් සඳහා යහපත් ප්‍රතිචාරයක් නොලැබුණි.

ආරක්ෂක සේවාවන්හි නිරත පෞද්ගලික ආරක්ෂක සමාගම් නියෝජනය කරන නිළධාරීන්  ඇතුළු එවන් ආකාරයේ සේවාවක නිරත එහෙත් තනි පුද්ගලයන් සේ කටයුතු කරන ආරක්ෂක නිළධාරීන් - සමස්ත ප්රමාණය 35,000 කට මඳක් වැඩිය. ආරක්ෂක සේවාවන් ලෙස මෙම ජේදය තුළ හැඳින්වෙනුයේ ආරක්ෂක අමාත්‍යංශයේ ලියාපදිචි සමාගම්ගතව දිවයිනේ සෑම ස්ථානයකම පාහේ ආරක්ෂාව සපයන පෞද්ගලික ආරක්ෂක සේවා ආයතනවල සේවාවෙහි නිරත පිරිස්ය. එවැනි පිරිස් 90,000 ක් පමණ සිටියද ඔවුන්ගෙන් තම ඡන්ද භාවිතය නිසිලෙස සිදුකොට ඇත්තේ කවුරුන්ද යන්න පිළිබඳව පැහැදිළි අදහසක් ලබාගත හැකි කිසිදු ලිඛිත සාක්ෂියක් හමු නොවේ. එහෙත් අදාළ පිරිස් හා පැවති සාකච්ජාවේදී විශේෂයෙන් අගනුවර කේන්ද්‍රියව කටයුතු කරන පිරිසේ බහුතරයක් සඳහා එකී අවස්ථාව හිමිව නොතිබූ බව පැහැදිළිය.

භික්ෂුණීන් වහන්සේලා - 8,000 කට වැඩි පිරිසක් සඳහා අවශ්‍ය පහසුකම් නොලැබේ. මෙරටේ භික්ෂුණී ආරාම 343 ක් තුළ වැඩ වාසය කරන භික්ෂුණීන් වහන්සේලා 8,000 කට අධික පිරිසක් ඡන්දය ප්‍රකාශ කිරීමේදී යම් ගැටළුවකට මුහුණ දී ඇත. ඊට අදාළ බලවත්ම හේතුව වන්නේ අදාළ භික්ෂුණීන් වහන්සේලා උපසම්පදාව ලත් භික්ෂුණීන් ලෙස පිළිගැනීමට මල්වත්ත සහ අස්ගිරිය ප්‍රධාන පාර්ශව ඉදිරිපත් නොවීමයි. එබැවින් එකී පාර්ශව වල කැමැත්තෙන් තොරව අදාළ  මෙහෙණීන් වහන්සේලා ද/දසසිල් මාතාවන්, භික්ෂුණීන් වහන්සේලා ලෙස හඳුනාගෙන නිසි ලිපියක් නිකුත් කිරීම බුද්ධ ශාසන කටයුතු පිළිබද දෙපාර්තමේන්තුව

මැලිවන අතර එබැවින් ජාතික හැඳිනුම්පතක් නිකුත් කිරීමට ද පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව ඉදිරිපත් නොවේ.

ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා එකී අනන්‍යතා පත්‍ර අවශ්‍ය බැවින් මෙම ගැටලුව දැනට බොහෝ කලෙක පටන් පැවතේ. වරක් මානව හිමිකම් කොමිෂන් සභාවද මීට අදාළව තම අදහස් දක්වමින් මෙකී ගැටළුව විසඳීම සඳහා වහ මැදිහත්වන ලෙස මැතිවරණ කොමිෂන් සභාවෙන් ද ඉල්ලා සිටියද මැතිවරණ කොමිෂන් සභාවේ අදහස වන්නේ මීට අදාළ පසුබිම්ගත කරුණු තම විෂය පථයෙන් බැහැර බවයි.

එනම් ඡන්ද ප්‍රකාශ කිරීම බලගැන්වීම උදෙසා ඕනෑම විටෙක තාවකාලික හැඳුනුම්පත ප්‍රමාණවත් බවත් එය තම කොමිෂන් සභාවට පහසුවෙන් ඉටුකළ හැකි කාර්යයක් බවත්වය. එහෙත් අදාළ මෙහෙණින් වහන්සේලාගේ අදහස වන්නේ තමන් හට හිමි

Journal of Humanities and Social Sciences 3 (1) 2020

**Higher Ordination of *Bhikkhunīs*:**
**Some Reflections on the Current Debate**

**D.K.M. Kaushalya Karunasagara**[1]

**Abstract**

*In Asian culture, almost all social institutions including religious institutions are male dominated. In religious contexts usually the decision-making power is wielded by male participants and sometimes decisions which concern women are also taken by them. In the Sri Lankan context, the existence of the Bhikkhunī order is not accepted by the Bhikkhu order authorities and not recognized by the Sri Lankan government based on the decision of Bhikkhu community by emphasizing that religious authority is more valued than the constitution of the country. Bhikkhunī's 'Right to Franchise' is denied as their identity is not approved by the government and they are recognized only as a Dasasil Māta. This controversy extends by developing different interpretations to Buddhist Vinaya rules enacted by the Buddha regarding Bhikkhunis. The aim of this paper is to appraise the Vinaya rules related to Bhikkhunīs in order to evaluate the validity of the rationality held by the Bhikkhu authority regarding their rejection of reviving the Bhikkhunī order in Sri Lanka. A descriptive content and historical analysis of the information from both primary and secondary sources reveals that the controversy around Bhikkhunī's rights to franchise and continued denunciation of the Bhikkhunī order has been a result of Vinaya rules being interpreted wrongly. Therefore, the paper concludes that the matter of accepting a revival of the Bhikkhunī order should be solved as soon as possible by the most venerable Mahā Sangha of all three nikāyas coming to a fair decision.*




අයිතියක් වන ජාතික හැඳුනුම්පත ලබාගැනීමෙන් අනතුරුව ඡන්ද භාවිතයට යොමුවන බවයි. මෙම සමීක්ෂණයට අදාළව කරුණු විමසීමේදී තහවුරු වූයේ යම් මෙහෙණින් වහන්සේලා පිරිසක්තාවකාලික හැඳුනුම්පත උපයෝගී කරගෙන පසුගිය ජාතික මැතිවරණ දෙකේදී තම ඡන්ද භාවිත කොට ඇති බවයි.

සුපිරි වෙළෙඳසැල්වල සේවයේ නිරත තරුණ තරුණියන් 12,000 ක පමණ පිරිසක්. මීට අදාළව මූලික වශයෙන් නිරීක්ෂණයට ලක්වූ ආයතන වර්ග කිහිපයක් ඇත. දත්ත සහ සංඛ්‍යා පිළිබඳව විමසමින් ලියන ලද ඉල්ලීම් සඳහා ප්‍රතිචාර අවම වුයෙන් අදාළ පාර්ශව සමඟ අවිධිමත් සාකච්ඡා පවත්වා මෙහි සඳහන් වන බොහෝ තොරතුරු තොරතුරු පෙළගස්වා ඇත. එහිදී කාර්ගිල්ස් සමූහ ව්‍යාපාරය, කීල්ස් සුපිරි වෙළෙඳ සැල් ජාලය, සතොස, සහ ආර්පිකෝ යන ව්‍යාපාර ජාල පමණක් මෙහිලා අවධානයට ලක්කොට ඇත. මෙකී ආයතන පද්ධතිය තෝරා ගැනීමේ නිර්ණායකය වූයේ එකී සේවා ආයතන වල බහුතරය විවිධ සේවා මුර යටතේ කටයුතු කිරීම සහ වෙළෙඳ සහායක මට්ටමේ බහුතරයක් පිරිස් අදාළ පළාත් වලින් බැහැර ප්‍රදේශ වලින් පැමිණ තාවකාලික ලැගුම්හල් තුළ වාසය කරමින් සේවයට පැමිණෙන්නන් වීමයි. මේ අනුව කාර්ගිල්ස් සමූහ ව්‍යාපාරයට අයත් සුපිරි වෙළෙඳ සැල් ජාලය ඇතුළුව සමස්ත ආයතන සමුහයෙහි සේවයේ නිරත පිරිස  පමණක් 9875 කි. ඔවුන් දැනට සේවා පවත්වා ගෙන යන සුපිරි වෙළෙඳ සැල් සංඛ්‍යාව 501 කි. ඉන් යටත් පිරිසෙන් 8,000 කට ආසන්න පිරිසක් අදාළ සුපිරි වෙළෙඳ සැල් ජාලයේ සේවාර්පිත පිරිස්ය. කීල්ස් සමූහ ව්‍යාපාරය දිවයින පුරා සුපිරි වෙළෙඳ  සැල් 116 ක් පමණ සේවයේ නිරත පිරිස 1800 ක් වේ. ඊට අමතර වශයෙන් දිවයින පුරා පිහිටි  ආර්පිකෝ සුපිරි වෙළෙඳ සැල්  ජාලයෙහි සහ සතොස තුළ  සේවයේ නිරත පිරිස පිළිවෙලින් 700 ක් හා  2100 ක් පමණ වේ.මෙකී පිරිස් අතරින් යම් ප්‍රමාණයක් නිවෙස් අසළ පවතින ඡන්ද මධ්‍යස්ථාන තුළ තම ඡන්දය ප්‍රකාශ කලද ඉන් සාතිශය බහුතරය නිතැතින්ම අදාළ සේවා ස්ථාන තුළ රැඳී සිටිය යුතු බැවින් ඡන්ද ප්‍රකාශ කිරීමේ අවස්ථාව මඟ හැරී ඇත.

ඉහත පාර්ශව වලට  අමතර වශයෙන් ශ්‍රී ලංකාවේ දිනක් තුළ සිදුවන  විවාහ මංගල්‍ය උත්සව ප්‍රමාණය ද සැළකිය යුතු ප්‍රමාණයකි. එය සාමාන්‍ය අගයක් ලෙස දිනකට 120 ක් සේ ගිණිය හැකිය. එහිලා  කරුණ වන්නේ වැදගත්ම මැතිවරණ දිනය ලෙස තෝරාගන්නා දිනය යම් හෙයකින් සම්ප්‍රදායානුකූළ නැකත් චාරිත්‍ර සහිත දිනයක් වුවහොත් එදිනට විවාහ ගිවිස ගන්නා හෝ විවාහ ගිවිස ගැනීම සහ විවාහ මංගල උත්සවය යන දෙකම එකම දිනෙක පවත්වන පිරිස බොහෝ වියහැකි බවයි. එබැවින් ඔවුන් හටද තම විවාහයට පෙර ඡන්දය ප්‍රකාශ කිරීමේ සුහුරු අවස්ථාවක් ලබාදීම ඡන්ද අයිතිය වඩාත් පුළුල් කිරීමේ ප්‍රවේශය තුළ සිදුකල හැකි කාර්යයකි.

දඹදිව /මක්කම සංචාරයේ යෙදෙන වන්දනාකරුවන්. මෙරටේ වසරක් තුළ මෙලෙස දඹදිව ඇතුළු තවත් බොහෝ ජාත්‍යන්තර ව ප්‍රචලිත ආගමික ස්ථාන ස්ථාන වෙත සෙන්දුවන ශ්‍රී ලාංකිකයන් ප්‍රමාණය 800,000 ඉක්මවා යන්නේය. මීට අදාළව කිසිදු රජයේ ආයතනයක යම් තොරතුරු පද්ධතියක් යාවත්කාලින නොවේ. එබැවින් අදාළ තොරතුරු මෙහිලා එක්රැස් කරගෙන ඇත්තේ එවැනි වන්දනා චාරිකා සංවිධානය කරන පිරිස් මඟිනි. එබැවින් මීට අදාළව දත්ත ලබාගැනීම සඳහා අනාගතයේ යම් සුවිශේෂී ක්‍රමවේදයක් අනුගමනය කල යුතුව තිබේ. කෙසේවෙතත් තම සංචාරක කාල සීමාව තුළ යම් මැතිවරණයක් ප්‍රකාශයට පත්වෙනම් ඊට අදාළව යම් විධික්‍රමයක් ඔස්සේ ඔවුන් හට ඡන්ද භාවිතය සඳහා අවකාශ සැලසීම මනා ප්‍රගතිශීලි පියවරක් වනු ඇත




| | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| DEPARTURES | 2,657,532 | 3,095,089 | 3,590,122 | 3,621,822 | 3,926,447 | 4,252,619 | 4,657,456 | 4,851,216 | 5,389,082 | 4,970,184 | 1,231,939 | 708,076 |
| ARRIVALS | 2,609,237 | 3,079,126 | 3,554,969 | 3,690,047 | 3,893,400 | 4,273,959 | 4,684,762 | 4,970,549 | 5,409,587 | 4,930,455 | 1,140,989 | 792,002 |



# ඉදිරි දැක්ම

මෙරටේ මැතිවරණ ක්‍රියාවලිය ලොව අනෙක් රටවල් හා සසඳා බැලීමේදී ඡන්දදායක විශ්වාසය දිනාගත් බොහෝ දුරට මානව සම්පත කෙරෙහි වැඩි බරක් තබා සිදුවන ප්‍රවර්තන කාර්යයකි. ඊට ලොව නව ප්‍රවණතාගත මැතිවරණ සංස්කෘතියේ නවාංග එක්කිරීම සිදුව ඇත්තේ මඳක් සෙමෙන් වුවද නව තාක්ෂණය සහ නවෝත්සාපාදකමය ප්‍රවණතා වැළඳගැනීමේ පුරුද්ද මැතිවරණ කොමිෂන් සභාව සතුව පවතීය යන්න පසුබිම්ගත කරුණු විමසීමේදී මනාව තහවුරු වේ. ඊට කදිම නිදසුන වන්නේ වසර 2016 දී පමණ මෙරටේ පැවති දකුණු ආසියානු මැතිවරණ බළධරයන්ගේ සමුළුවයි. කොළඹදී මුළුදුන් එහි දකුණු ආසියා කලාපයට තීරණාත්මක ලෙස බලපාන මැතිවරණ කළමනාකරණයේ ආවේනික අභියෝග සහ නව මං පිළිබඳව වඩාත් පුළුල්ව සාකච්ජාවට බඳුන් කරන ලදි. එහි එක් ප්‍රථිපලයක් වූයේ කොළඹ ප්‍රකාශනය (Colombo Declaration) සම්මත කිරීමයි. කොළඹ ප්‍රකාශනයෙහි ප්‍රමුඛ අභිලාශය වූයේ මෙරටේ දිවිගෙවන අවශ්‍යයෙන්ම මැතිවරණ සහභාගිත්වය දැක්විය යුතු ආබාධ සහිත තැනැත්තන්ගේ ඡන්ද අයිතිය තහවුරු කිරීම සඳහා දකුණු ආසියා කලාපීය මැතිවරණ බළධරයින්ගේ ඒකාබද්ධ ප්‍රයත්නයක් දියත් කිරීමයි.

එහිලා වැදගත් අනෙක් තීරණාත්මක සාධකය වන්නේ මැතිවරණ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් සඳහා සමස්ත සමාජයේම පවත්නා බරපතල උනන්දුවයි. මැතිවරණ ක්‍රමය වෙනස් කිරීමේ සිට දෘෂ්‍යාබාධිත ඡන්දදායකයෙක් සඳහා වන ස්වායත්ත ඡන්ද ප්‍රකාශන මාදිලියක් හඳුන්වා දීම දක්වා වූ පුළුල් පරාසයක ප්‍රතිසංස්කරණ මාලාවක් මෙරටේ පළමු වරට එළිදැක්වූ මැතිවරණ ප්‍රතිසංස්කරණය සඳහා වූ නිර්දේශ මාලාවේ සඳහන් වූ අතර එය ප්‍රකාශයට පත්වූයේ දශක එකහමාරකට පෙරදීය. ඊට සමගාමීව මෑතදී ද නව මැතිවරණ ප්‍රතිසංස්කරණ වාර්තාවක් පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් මඟින් නිකුත් කෙරිණි. පැෆ්රල් සංවිධානය ඇතුළු මැතිවරණ

නිරීක්ෂණ සංවිධාන 156 ක් පමණ ඊට අදාළව තම අදහස් සහ යෝජනා ඉදිරිපත් කොට තිබුණි. එලෙස ඉදිරිපත් කරන ලද යෝජනා අතර බොහෝ සංවිධාන කිසිදු ප්‍රතිවිරෝධතාවකින් තොරව ඉදිරිපත් කොට තිබූ එක් පොදු යෝජනාවක් වූයේ විකල්ප ජන්ද ක්‍රමයක් පිළිබඳව අදහසයි.

## උභතොකෝටිකමය ප්‍රවේශයක්

විකල්ප ජන්ද භාවිතයට අදාළ විධික්‍රම යෝජනා කිරීම සිවිල් සමාජය ඇතුළු වෙනත් පාර්ශව නියෝජනය කරන ක්‍රියාකාරීන් හට කල හැකි එකක් වුවද ඊට අදාළ තාක්ෂණික හවුල්කාරිත්වය ගත යුතුව ඇත්තේ ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාවයි. තවද එහි අගය වටහා ගත යුතු අනෙක් පාර්ශවය නම් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවයි. තමන් ද තෝරාගැනීමකට ලක්කරන ජන්දදායකයන් පිරිසේ සැළකිය යුතු පදාසයක් මැතිවරණ ක්‍රියාවලියෙන් මුළුමනින්ම ඉවත්කොට ඇතිබව පළමුව දැනගත යුත්තේද, ක්‍රියාකළ යුත්තේද මේ පිරිසයි. එහෙත් යථාර්තය එතරම් සුමිහිරි නැති බව හැඟෙන්නේ ඔවුන් සාතිශය කණගාටුදායක ලෙසින් මෙකී සමාජ සංවේදනාව යටපත් කොට ඇති ආකාරය දිස්වන විටදීය. නිදසුනක් ලෙස විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්ගේ ජන්ද අයිතිය තහවුරු කිරීමේ අරමුණින් ස්ථාපිතව පැවති පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව දැක්විය හැකිය. එහි පළමු කාරක සභාව කිසිදු එලදායි හමුවකින් තොරව විසිර ගිය අතර ඉනික්බිතිව පත්කළ දෙවැනි තේරීම් කාරක සභාව මෙතෙක් සිදුකොට ඇත්තේ කුමක්දැයි යන්න අභිරහසකි.

අනෙක් පසින් මීට අදාළ යෝජනා සහ නිර්දේශ ඉදිරිපත් කිරීමේදී තත්කාලීනව පවත්නා අභියෝග පිළිබඳව ද ප්‍රමාණවත් දැනුම්වත් වීමක් සමාජයේ නැත්තේ නොවේ. නිදසුනක් ලෙස විදෙස්ගත ශ්‍රී ලාංකේය ප්‍රජාවේ ජන්ද අයිතිය තහවුරුකිරීම සඳහා යම් ක්‍රමවේදයක් හඳුන්වා දීම පිළිබඳව සළකා බැලිය හැකිය. අදවන විට බහුතර ශ්‍රී ලාංකේය ප්‍රජාවක් දිවිගෙවන (ශ්‍රමික ප්‍රජාව) මැදපෙරදිග යනු පුද්ගල නිදහස යම් සීමා කිරීමකට යටත් කරන ලද කලාපයකි. එබැවින් යම් ක්‍රමවේදයක් ඔස්සේ ජන්දය ප්‍රකාශ කිරීමේ පහසුකම් ප්‍රවර්ධනය කළද, දේශපාලන පක්ෂ බොහෝ ප්‍රමාණයකට සහ අපේක්ෂකයන් බහුතරයකට අදාළ කලාපයට පිවිස හෝ වෙනත් සන්නිවේදන මාර්ග ඔස්සේ ජන්දදායකයන් වෙත ප්‍රවේශ වීම ඉතා දුෂ්කර වනු ඇත. එනයින් බලන කල පැහැදිළි වන්නේ සමහර විටෙක නිත්‍යානුකූල පසුබිමක් යටතේ පහසුකම් ප්‍රවර්ධනය කිරීම එලෙස නොකර සිටීමටත් වඩා හානියක් විය හැකි බවයි. කෙසේ වෙතත් වැදගත් වන්නේ අදාළ පසුබිම යටතේ කරුණු නිවැරදිව විග්‍රහ කිරීමයි.

මෙහිදී දැක්විය හැකි අනෙක් කරුණ නම් සමාජයේ එතරම් ප්‍රචලිත නොවුණද තැපැල් ජන්ද පහසුකම ලබාදීම වැනි කාර්යයකදී මැතිවරණ කොමිෂන් සභාව බොහෝ විට නම්‍යශීලිව කටයුතු කරන ලද අවස්ථා රැසක් පසුගිය මැතිවරණ ආශ්‍රිතව හමුවන බැවින් එවැනි අවස්ථා ඉහත අගතියට පත්වන පාර්ශව සඳහා සාධාරණයක් ඉටුකිරීම වෙනුවෙන් යොදාගත හැකිය යන්නයි. නිදසුනක් ලෙස ජන්ද මධ්‍යස්ථාන ආශ්‍රිතව හෝ මැතිවරණ දිනයේ වෙනත් කවර හෝ කාර්යයක් නිශ්චිතව පවරා ගන්නා යම් රජයේ සේවකයෙක් වේද, එබැවි පූර්වයෙන් දන්වා තැපැල් ජන්ද ඉල්ලුම්කරන ලද සියළු පාර්ශව වෙත අදාළ පහසුකම ලබාදීම සළකා බැලිය හැකිය. පළාත් පාලන මැතිවරණ නීතියට අනුගතව එහි 39 ආ මඟින් එකී කාර්යය සඳහා මැතිවරණ කොමිෂන් සභාව බලගන්වා ඇත. මෙමඟින් පැහැදිළි වන එක් කරුණක් නම් දැනට පවත්නා මැතිවරණ නීති යටතේ පවා යම් සාර්ථක මැදිහත්වීමක් සිදුකිරීමේ හැකියාව මැතිවරණ කොමිෂන් සභාව සතුව පවත්නා බවයි.

# අවස්ථානුකූල මැදිහත්වීමක් සඳහා වන යෝජනා මාලාවක්

විකල්ප ජන්ද විධික්‍රම හඳුන්වා දීම මඟින් සම්ප්‍රදායික මැතිවරණ ක්‍රමයේ පවත්නා ජීව ගුණය පිරිහෙළණු ඇතැයිද එය මැතිවරණ පරිපාටින් අනවශ්‍ය පැටළිලි සහගත බවකට ලක්කරනු ඇතැයිද යනුවෙන් වන මත සමාජගතව ඇති බව නොරහසකි. එපමණක් නොව නූතන සන්නිවේදන තාක්ෂණය වෙත මැතිවරණ මෙහෙයුම් කාර්යයන්හි බර පවරා දීම අවශ්‍යයෙන්ම මැතිවරණ ක්‍රමයක පැවතිය යුතු රහස්‍යභාවය සහ විශ්වසනීයත්වය අවදානමට ලක්කරන්නේය යනුවෙන්ද වන මැසිවිල්ලකි. එහෙත් ලොව ක්‍රමයෙන් බිහිවෙමින් පවත්නා නව පන්නයේ මැතිවරණ මෙහෙයුම් ක්‍රියාවලීන් අධ්‍යයනෙහිදී පෙනී යන්නේ සම්ප්‍රදාය සහ නූතනත්වය මිශ්‍රිත නව එළඹුම් මඟින් මැතිවරණ විෂයෙහි සිදුවෙමින් පවත්නා යහපත් පරිවර්තනයයි. එකී පසුබිම ද පාදක කරගනිමින් වඩාත් ක්‍රියාකාරී සැළැස්මක් සහ වැඩපිළිවෙලක් උදෙසා පහත යෝජනා සහ නිර්දේශ මෙහිලා ඉදිරිපත් කරනු ලැබේ.

## 01. දැනුම්වත් කිරීම

01. විකල්ප ජන්ද භාවිතය (Advance Voting) වඩාත් නිවැරදිව අර්ථ ගැන්වීම සහ එකී ජන්ද භාවිතයේ පවත්නා අගය පිළිබඳ ප්‍රමාණවත් සමාජ අවධානයක් යොමුව නොපැවතීමේ පසුබිම මෙහිදී වෙසෙස් අවධානයට ලක්වේ. එබැවින් අදාළ ක්ෂේත්‍රයේ පවත්නා ස්වභාවය සහ විකල්ප ජන්ද භාවිතයේ වැදගත්කම පිළිබඳව යම් සරල ප්‍රකාශණයක් එළිදැක්වීම වැදගත්ය. එහි ඉතා සරලව මෙකී පදරුත් මෙන්ම වැදගත්කම හුවා දැක්වීම තුළින් යම් සමාජ අවධානයක් ජනිත කිරීම පහසුය.

මෙහි හඳුනාගෙන ඇති එක් එක් ක්ෂේත්‍ර නියෝජනය කරන වගකිවයුතු පාර්ශව එක් ස්ථානයකට කැඳවීම සහ විකල්ප ජන්ද භාවිතයේ තීරණාත්මක වැදගත්කම පිළිබඳ යම් විධිමත් සාකච්ජාවක් සිදුකිරීම වැදගත්ය

විකල්ප ජන්ද භාවිතයේ අවස්ථා සැලසීම උදෙසා දැනටමත් මැතිවරණ නීති පද්ධතිය තුළ පවත්නා ප්‍රතිපාදන සහ ඊට සමගාමී අවස්ථා කළමනාකරණය කරගැනීම සඳහා වෙනත් රාජ්‍යය/මැතිවරණ කළමනාකරණ ආයතන අනුදත් ක්‍රියාමාර්ග පිළිබඳව සම්මන්ත්‍රණයක් සංවිධානය කිරීම උචිතය

## මැතිවරණ කළමනාකරණ ආයතනය
## ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව

මැතිවරණ කොමිෂන් සභාව දැනටමත් විශේෂ ව්‍යාපෘති සහ තවත් වෙසෙස් කාර්යයන් උදෙසා වෙනම ම වැඩසටහන් සහ පරිපාලන ඒකක පවත්වා ගනිමින් සිටිනු දිස්වේ. එබැවින් යම් කෙටි කාල සීමාවක් සඳහා විකල්ප ජන්ද විධික්‍රම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ඊට ම වෙන්වූ ඒකකයක් ස්ථාපිත කිරීම අත්‍යවශ්‍යය

දැනටමත් කැබිනට් මණ්ඩලය විකල්ප ජන්ද ක්‍රම සළකා බැලීම සඳහා තම අනුමැතිය ලබාදී ඇති අතර පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවද එකී කාර්යය මැතිවරණ කොමිෂන් සභාව මඟින් සිදුකරනු ඇතැයි අපේක්ෂා කරන බව එකී කමිටු වාර්තාව මඟින් දක්වා ඇත. එබැවින් දැනටමත් යෝජිත ක්‍රියා පිළිවෙල කුමක්ද යන්න හා වඩාත් විධිමත් නෛතික ප්‍රතිපාදන මාලාවක් සකසා ගැනීම සඳහා සර්ව පාක්ෂික සහ සර්ව පාර්ශව හමුවක් සංවිධානය කොට එමඟින් ජනිත වන අදහස් මාලාවට අනුගතව ක්‍රියා කිරීම යෝග්‍ය වේ

දැනටමත් යම්තාක් දුරකට නිමාකොට ඇති පරිදි ආබාධ සහිත ජන්දදායකයන්ගේ දත්ත යාවත්කාලීන කිරීම කෙටිකලකින් නිමාකිරීම සහ විදේශ අමාත්‍යංශය ද ඇතුළත් රජයේ ආයතන පද්ධතිය මෙන්ම ආයෝජන මණ්ඩලය වැනි ආයතන ද එක්කරගන්නා විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ නිවැරදි දත්ත පද්ධතියක් යාවත්කාලීන කිරීම අවශ්‍යයෙන්ම සහ පළමුව සිදුකල යුතු කාර්යයකි.

## මැතිවරණ නිරීක්ෂණ සංවිධාන, සිවිල් සමාජ සංවිධාන සහ මාධ්‍ය

මැතිවරණ කොමිෂන් සභාවද ඇතුළත් කරගන්නා ආකාරයේ විධිමත් හෝ අවිධිමත් යාන්ත්‍රණයක් පිහිටුවා ගනිමින් තත් කාර්යයෙහි ප්‍රතිපලයක් උදාකරගන්නා තෙක් සාමුහිකව ක්‍රියාකිරීම සඳහා අදාළ පාර්ශව එක්කරගත යුතුය. එලෙස නිර්මිත වේදිකාවක් ඔස්සේ මහජන නියෝජිතයන් දැනුම්වත් කිරීම, ජාත්‍යන්තර අත්දැකීම් බෙදාහදා ගැනීම වැනි ක්‍රියාකාරකම් නිර්මාණය කල හැකිය. වඩාත් නිර්මාණාත්මක පණිවුඩයක් සමාජගත කල හැක්කේ කවර ආකාරයෙන්ද යන්න විමසා ඊට අනුගතව සම්ප්‍රදායික සහ සමාජ ජාල මාධ්‍ය වේදිකා ඇමතිය යුතුය.

විකල්ප ඡන්දක්‍රම පිළිබඳ සාකච්ජාවේ වඩාත් සුවිශේෂී ලක්ෂණයක් වන්නේ ඊට අදාළ දත්ත, මූලික සමීක්ෂණ තොරතුරු නොමැති වීමයි. මේ අනුව ඉහතින්ද දක්වා ඇති පරිදි එවන් පුළුල් සමීක්ෂණයක් (Baseline Research) සඳහා නිශ්චිත මැදිහත්වීමක් දැක්වීම වැදගත්ය. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව ප්‍රධාන ආයතන එහි ප්‍රමුඛත්වය දැරීම වැදගත්ය.

## පාර්ලිමේන්තුව

දැනටමත් ප්‍රතිෂ්ඨාපිත විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්ගේ ඡන්ද අයිතිය (out of Country Voting) පිළිබඳ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව වහා පණගැන්වීම සඳහා අදාළ දේශපාලන පක්ෂ නායකයන් ප්‍රෝත්සාහීව කටයුතු කරනු දැක්ම ශ්‍රී ලාංකේය ඡන්දදායකයන්ගේ අපේක්ෂාවයි. එබැවින් එකී පණිවුඩය නිසිලෙස අවබෝධකරගත් බව පෙන්වීම ඔවුන් සතු ප්‍රගතිශීලි කාර්යයකි.